**2026.05.12 වන දින සාමාන්‍ය රැස්වීම් වාර්තාව.**
**ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.**

2026 මැයි මස 12 වන දින පෙ.ව 9.30 ට ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඇහැලියගොඩ ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පැවති සාමාන්‍ය රැස්වීම් වාර්තාවයි.

**සහභාගීත්වය:-**

01.ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා
02. ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා
03.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා
04.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා
05.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා
06.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා
07.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය
08.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය
09.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා
10 ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා
11.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා
12.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා
13.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය
14.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා
15.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය
16.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා
17.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා
18.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා
19.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා
20.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා
21.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා
22.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා
23.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය
24.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා
25.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා
26.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා
27.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා

28 ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා

29.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුම

30. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා

31. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිනිය

**නොපැමිණීම්**

01. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා

02. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය

03. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා

04.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා

05. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා

**කාර්ය මණ්ඩලය**

01. ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා - ලේකම්

02. ජී.අයි.කේ.ජයතුංග මිය - සංවර්ධන නිලධාරී

03. සී.චන්දිමා ප්‍රියදර්ශනී මිය - වැඩ ක්ෂේත්‍ර කම්කරු

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් පැමිණ සිටි මන්ත්‍රිරුන්, මන්ත්‍රිවරියන්, මාධ්‍යවේදින්, සහා ලේකම්තුමා හා කාර්යාලයේ නිලධාරින් දෙපළ පිළිගැනිමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

(අ) 2026.04.07 වන දින පැවති සාමාන්‍ය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

2026.04.07 වන දින පැවති සාමාන්‍ය රැස්වීම් වාර්තාව සභා සම්මත කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් දන්වන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා

2026.04.07 වන දින පැවති සාමාන්‍ය සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා

ගරු සභාපතිතුමනි, 2026.04.07 වන දින වාර්තාව පැරණි වාර්තා ඉදිරිපත් කළ ආකාරයට වාර්තාව ලියවී නැති බවත්, වෙනදා වර්තා කළ ආකාරයට වාර්තාව ඉදිරිපත් කළ යුතු බවත්, කතා කරන දෙය කියන භාෂාවෙන් ලියවිය යුතු බවත්, මෙතෙක් කල් සභා වාර්තා සැකසී ඇත්තේ ලිඛිත භාෂාවෙන් බවත්, ආණ්ඩු පක්ෂයේ හරි විපක්ෂයේ හරි මොනව හරි වචනයක් කියනවා නම් ඒ වචනය මෙහිදි ගම්‍ය නොවන බවත්, එම නිසා වාර්තාව සභාවේ කතා කරන භාෂාවෙන් සකස් කළ යුතු බවට ඉල්ලීමක් කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා

ගරු සභාපතිතුමනි, මීට පෙර සභා වාරෙදි තමා කරන ලද යෝජනාවක අඩුපාඩුවක් පිටු අංක 20 හි තිබෙන බවත්, තමන් කරන ලද යෝජනාව වන්නේ, න්‍යාය පත්‍රය සැකසීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේදී යම් නිශ්චිත ක්‍රමවේදයකට ඒ දෙය කළ යුතු බවත්, යෝජනාවක් කරන විට එය මෙහෙට අත්‍යවශ්‍ය නොවෙන්න

පුළුවන්, නමුත් එය ගමට අත්‍යාවශයයි. යනුවෙන් සඳහන් කලේ උදාහරණයක් වශයෙන් බවත්, තමන් යෝජනා කරලා තියෙනවා, මම උදාහරණයක් තමයි යෝජනා කළේ එම අත්‍යාවශ්‍ය යෝජනා විතරක් ගේන්න කියන එකට. උදාහරණය තමයි බෝපැත්ත දිද්ද කොට්ඨාශයේ අමුණ පාලම කියලා. නමුත් සඳහන් වෙලා තියෙන්නේ අමුහේන පාලම කියලා. එය අමුණ පාලම විය යුතු බවත්,ඊළඟට තියෙන්නේ අමුහේන පාලම උඩින් කසළ අංගනයට ට්‍රැක්ටරය යන්නේ කියලා බවත්, එය අමුහේන පාලම උඩින් නෙමෙයි අමුණ පාලම උඩින් තමයි ට්‍රැක්ටරය යන්නේ. ඒ පාරෙ පැත්තකින් ලොකු වලවල් හැදිලා තියෙනවා. ඒ පාරෙ පැත්තකින් නෙවෙයි තමන් යෝජනා කළේ ඒ අමුණට දාල තියෙන කොන්ක්‍රීට් එකේ වලක් තියෙනවා කියලා. ඒ කොන්ක්‍රීට් එක කැඩි කැඩි ගියොත් තවත් යන්න බැහැ. එම නිසා එය හැකි ඉක්මනට සංවර්ධනය කළ යුතුයි කියලා.ඉක්මනින් සංවර්ධනය කලේ නැත්නම් ඒ පාලම තව කැඩි කැඩී යනවා. එය එලෙස නිවැරදි විය යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා **විසින් ප්‍රකාශ කරන ලදී.**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි **ඩී.ගයනී බුද්ධිකා මැතිණිය**

ගරු සභාපතිතුමනි, මෙම වාර්තාව සකස් කිරීමේදී ප්‍රකාශ කරන කරුණම මෙහි සඳහන් නොවී ඇති බවත්, එහිදි තමන් සඳහන් කළේ ගමේ අපිට උදව් කරනවා සියපත් මිතුරෝ කියල සමිතියක්.වාර්තාවේ සඳහන් වෙලා තියෙන්නේ,පරිසර මිතුරෝ කියල සමිතියක් කියලා. එය නිවැරදි කරන ලෙස ඉල්ලා සිටින බවත්, ඊට අමතරව රු.549,000.00ක ව්‍යාපෘතියක් සිදු කළ බව සඳහන් වෙනවා .එය දැඩි ලෙස වැරදි.එය නිවැරදිව සඳහන් විය යුතුයි.මෙය ඉතාමත්ම වටිනා ලියවිල්ලක් නිසා එය රුපියල් 449,000.00 ක මුදලක් ලෙස නිවරදි විය යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ඩී.ගයනී බුද්ධිකා මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා

ගරු මන්ත්‍රීවරු සංශෝධන ඉදිරිපත් කළ බවත්, එම සංශෝධන පිළිගන්න වෙන බවත්,මෙම රෙකෝඩරය මන්ත්‍රිවරු කතා කරන තැනට යොමු වෙන්න අවශ්‍ය බවත්, හැම මයික් එකක් ම ක්‍රියා නොකරන බවත්, නිලධාරීන්ට දොස් කියන්න හිතෙන්නෙත් නැති බවත්, අපේ අඩුපාඩුත් අපි හදාගන්නත් වෙන බවත්, කතා කරන විට රෙකෝඩරය මන්ත්‍රීතුමා සහ මන්ත්‍රීතුමිය වෙතට යොමු කරන්නට දැන් සිට කටයුතු කරන බවත්, සභාවේ මෙතෙක් කල් අනුමත කළේ ලක්ෂ පහෙන් පහත ව්‍යාපෘති බවත්, නිශ්චිත කාරණාව පැහැදිලි කරදීම පිළිබඳව ස්තුතිවන්ත වන බවත්, ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් 2026.04.07 දිනැති සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

සාමාන්‍ය සභා වාර්තාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමිල් නිමේෂ් බණ්ඩාර විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2026.04.07 වන දින පවත්වන ලද සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත විය.

(ආ) සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.

**කිසිවක් නැත.**

(ඇ) සභා රැස්වීමට නොපැමිණ සිටිමේ අවසරය සඳහා වන යෝජනා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා ඒ අනුව 2026-05-12 වන දින මහා සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වා ලිපි යොමුකර තිබෙන බවත්, එම ලිපි මේ මොහොතේ සභාගත කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමාගේ ලිපියේ අත්සනක් නොමැති බවත්, එතුමාගේ මව

අසනීප තත්වයෙන් පසුවන බැවින් දුරකථනයෙන් ඒ බව දැන්වූ බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.**

සාමාන්‍ය සභා රැස්වීමට පැමිණිය නොහැකි බව දන්වා ඇති ලිපි අනුව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා යන මන්ත්‍රිතුමන්ලාගේ හා මන්ත්‍රිතුමියගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

සාමාන්‍ය සභා රැස්වීමට පැමිණිය නොහැකි බව දන්වා නිවාඩු ඉල්ලා ඇති සභික මහත්ම මහත්මීන් වෙත නිවාඩු අනුමත කිරීමේ යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී **දිලීන් කරුණාපාල මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව අදහසක් මේ වෙලාවේ කියන්න කැමති බවත්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාශයෙන් ඉදිරිපත් කළ චක්‍රලේඛයක් මඟින්, හදිසි අවශ්‍යතාවන් වලදී ලිඛිතව නිවාඩු ඉල්ලීම අවශ්‍යත් නැති බව දක්වා ඇති බවත්, වට්ස්ඇප්, SMS පණිවිඩ මගින් හෝ දුරකතන දැනුම් දීම් මගින් දැනුම් දී නිවාඩු අනුමත කර ගැනීමේ ක්‍රමයක් තියෙන බව මේ වෙලාවේ සඳහන් කරන බවත්, දැන් පවතින තාක්ෂණයද උපයෝගී කර ගෙන නිවාඩු අනුමත කර ගැනිමට හැකි නම් එය සුදුසු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

චක්‍රලේඛ නිකුත් කර ඇත්තේ රාජ්‍ය නිලධාරීන් සඳහා බවත්, ඉදිරියේදි මන්ත්‍රිවරුන්ටත් ඒ අවස්ථාව ලැබීමට පුලුවන් බවත්, දැනට තිබෙන්නේ ගරු ආණ්ඩුකාරතුමිය විසින් ප්‍රකාශයට පත් කර ඇති සභා රීති අනුව කටයුතු කිරීමට බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(ඈ) ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරිම.

"දිවා රාත්‍රී පීඩාකාරී ලෙස ශබ්ද විකාශණ යන්ත්‍ර යොදා කරනු ලබන මහජන අපහසුතාවය දැනුවත් කිරීම සම්බන්ධවයි.

පහත නම් සඳහන් අපහට මීන්නාන හෝම් ගාඩන්හි පවත්වන උපන්දින සාද, කොටහලු මඟුල්, මංගල සාද සැමරුම් උත්සව, අවුරුදු උත්සව යනාදිය අධික ශබ්දවාහිනී යන්ත්‍ර යොදා සිදු කරන අතර රාත්‍රී 11න් පසුවද මෙම සාද පවත්වනු ලබයි. කිහිප වරක් 119 හදිසි ඇමතුම් අංකය අමතා පැමිණිලි කර ඇහැලියගොඩ පොලිසිය පැමිණ තදින් අවවාද කර නවත්වන ලදී. මෙය අප නිවෙස් වලට මහත් අපහසුතාවයකි. මහත් ඝෝෂාකාරී බවකි. කුඩා දරුවන්ද අප නිවෙස්වල සිටින බැවින් මත් වතුර බී ගත් මිනිසුන් කලහකාරී ලෙස හැසිරෙන අතර පරුෂ වචන වලින් බැන ගනිති. මෙය හුදෙක් අප හට මානසිකව ද පීඩාවක් ගෙන දෙන්නකි. මෙයින් වැඩිපුරම බලපෑමක් වන්නේ මේ අසලම ඇති නිවෙස් වෙතයි. මේ සම්බන්ධව අප නිවෙස්වල සිටින අය දැඩි ලෙස විරෝධ වන අතර මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කර මෙම සිදුවීම නැවත නොවීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි."

ටී.අයි.මුණසිංහ,එච්.ආර්.ටී.හිරිපිටිය, එම්.එම්.නිහාල් ආනන්ද , යන අය විසින් මෙම ලිපිය යොමු කර තිබෙන බවත්, ඇහැලියගොඩ ප්‍රාදේශිය ලේකම්තුමාටත්, මීන්නාන වසමේ ග්‍රාම නිලධාරීතුමාටත් පිටපත් යොමුකර තිබෙන බවත්, මෙය අදාළ කමිටුවට යොමු කර තීන්දුවක් ගැනීමට කටයුතු කරමු යැයි, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ගියවර ඇහැලියගොඩ ජාතික පාසල සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කළ බවත්, ඒ පිළිබඳව දැනගැනීමට කැමති බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

කාරක සභාවට යොමු කර ඇති බවත්, එය කාරක සභා අවස්ථාවේ සාකච්ඡා කිරීමට කටයුතු කළ බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(ඉ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

කිසිවක් නැත.

(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා.

01 (i) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා.

දිවුරුම්පිටිය ඇළ මාර්ගයේ මැතිවරණ නිවාස 10 යේ අංක 3 නිවසට යාබද නිවස සංවර්ධන අධිකාරියට අයත් පර්චස් 10 ක් පමණ ඉඩම ප්‍රජා සංවර්ධන කමිටුවේ ව්‍යාපෘතියක් සඳහා සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

01 (ii) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා.

දිවුරුම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ අ.ග.පි. 709 හි කැබලි අංක 214 ට යාබද 202 2/2 දරණ විදුලි රක්ෂිතයට අයත් පර්චස් 10 ක් පමණ වන බිම් කොටස ප්‍රජා ශක්ති වැඩසටහනේ ව්‍යාපෘතියක් සඳහා ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.

මෙම යෝජනාව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

01 (iii) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා.

දිවුරුම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ අ.ග.පි. 709 හි කැබලි අංක 34 අලියමල හේන වත්ත පර්චස් 32 ක පමණ පොදු කටයුතු සඳහා වෙන් කර ඇති ඉඩමේ සේවා පියසක් ගොඩනැගීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මීට පෙර සභා වාරයක මෙවැනිම යෝජනාවක් ඇහැලියගොඩ අස්ගඟුල උතුර ග්‍රාම නිලධාරී වසමටත් සේවා පියසක් අවශ්‍ය බව දන්වා යෝජනාවක් සභාවට ඉදිරිපත් කළ බවත්, අස්ගඟුලේ තිබෙන සුසාන භූමියෙන් පර්චස් 3 ක් ලබා ගෙන සේවා පියස ඉදිකරමු යනුවෙන් එහිදී තමා ප්‍රකාශ කළ

බවත්, නමුත් එය විෂය පථයට අයත් නොවන බව දන්වමින් එම යෝජනාව ඉවත් කළ බවත්, දැන් සභා විෂය පථය හරහා මෙවැනි යෝජනාව ඉදිරිපත් කිරිමට අවශ්‍ය කුමක් හෝ චක්‍රලේඛයක් ලැබී තිබෙනවා ද යන්නත්, විමසිම් කරන ලද අතර, මෙවැනි යෝජනා සිදු කිරිම අත්‍යවශ්‍ය බවත්, තමා ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳවත් අවධානය යොමු කරන ලෙසත් මේ වෙලාවේ යෝජනා කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එය සභාවට අයත් ඉඩමක්ද යන්න ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා ගෙන් විමසන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා

ගරු සභාපතිතුමනි, එය ප්‍රාදේශිය ලේකම්ට අයත් ඉඩමක් නොවන බවත්, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය අයත් ඉඩමක් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මේ සඳහා බලාපොරොත්තු වන්නේ සභා ප්‍රතිපාදන ලබා ගැනීමට ද යන්න ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් විමසන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා.

ගරු සභාපතිතුමනි, සභාවේ ප්‍රතිපාදන ලබා ගැනිමට බලාපොරොත්තු නොවන බවත්, පළාත් සභා ප්‍රතිපාදන ලබා ගැනීමට බලාපොරොත්තු වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා පෙ.ව 10.05 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

මෙය සභාවට අයත් ඉඩම් කොටසක් නොවන නිසා සභා ප්‍රතිපාදන දිය නොහැකි බවත්, රංජිත් මන්ත්‍රීතුමාගේ යෝජනාව සඳහා අපේ ප්‍රතිපාදනද, තමාට ඒ යෝජනාව සඳහා ඉල්ලූ ප්‍රතිපාදන සම්බන්ධව මතක නැති බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, එහිදී තමා ප්‍රකාශ කළේ සභා ප්‍රතිපාදන ලබා දෙන ලෙස නොවන බවත්. මේ රණවිර මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉවත් නොකරන ලෙසත් ප්‍රකාශ කළ අතර, තමා ගියවර ප්‍රකාශ කළේ ගරු සභාපතිතුමාගේ හා ගරු මුන්සීර් මන්ත්‍රීතුමාගේ බල ප්‍රදේශය බවත්, සභා උඩ්ඝතයන් ගෙන ඒ සඳහා ප්‍රතිපාදන ගන්න පුළුවන් අමාත්‍යාංශ වලට යොමු කර, ක්‍රියාත්මක කරමු යන්න බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා මෙහිදී ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා පෙ.ව 10.10 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, සේවා පියසවල් ඉදිකිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් බවට පත්වෙලා තිබෙන බවත්, රාජ්‍ය නිලධාරීන්ට ඔවුන්ගේ ක්ෂේත්‍ර කාර්යයන් පවත්වාගෙන යාමට දැනට කඩ කාමරයක් හෝ නිවසක් හෝ සොයා ගැනීමට අධික මුදලක් ගෙවීමට සිදු වන බවත්, ඒ නිසා සේවා පියසවල් සඳහා රජයේ අනුග්‍රහයක් අවශ්‍ය බවත්, රාජ්‍ය නිලධාරීන්ට කාර්යාල පවත්වා ගෙන යැමට සේවා පියසවල් දැඩිව අවශ්‍ය වන යුගයක් බවත්, නමුත් රජයෙන් කාර්යාල සඳහා වෙන් කරන මුදල රාජ්‍ය නිලධාරියෙකුට කාර්යාලයක් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් නොව බවත්, එම නිසා කෙසේ හෝ ආයතන සමඟ සම්බන්ධීකරණයක් කර සේවා පියසවල් ගොඩනැගීමට කරන යෝජනා වැදගත් කොට සලකා ප්‍රමුඛතාවය ලබාදීම සුදුසු බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා.

එය හොඳ අදහසක් බවත්, එය සම්බන්ධීකරණ කමිටුවට යොමු කිරීමට කටයුතු කරන බවත්, ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා

ගරු සභාපතිතුමනි, සම්බන්ධීකරණ කමිටුවේදී මේ පිළිබඳ කතා කළ බවත්, එය අත්‍යවශ්‍ය කටයුත්තක් ලෙස ඇමතිතුමත්, ලේකම්තුමියත් සඳහන් කළ බවත්, තමන් විශේෂයෙන් යකුදාගොඩ සේවා පියස ගැන කතා කළ බවත්, එහිදී අවසානයේදී ඉඩමක් පරිත්‍යාග කරන්න පුද්ගලයෙක් ඉදිරිපත් වුණ බවත්, සභාපතිතුමාගේ යෝජනාව අනුව එහිදී සුසාන භූමියෙන් කොටසක් ඒ සඳහා ලබා දීමට පොරොන්දු වීමත් සමඟ, එම ඉඩම රෝහලට අයිති බැවින් ඒ සඳහා ලියුම් ගහල තිබුණ බවත්, ඉන් පසු රෝහල සමඟත් සාකච්ඡා කළ බවත්, අවසානයේ ඒ ඉඩම ලබා දීමට රෝහල කැමති වූ බවත්, අපේ සියලුම මන්ත්‍රීවරුන් කතා කරන්නේ,අපිට පෞද්ගලිකව නෙවෙන බවත්, මේ රජයේ සියලුම නිලධාරීන්ට තියෙන අපහසුතා ගැන බවත්, එය පැහැදිලි කාරණාවක් බවත්, තමා යකුදාගොඩ ගැන කතා කරන්නේ, එක කුටියක් තුළ නිලධාරීන් හතර පස් දෙනෙක් හිර වෙලා සිටින බවත්, එසේ රාජකාරිය කිරීමට අපහසු බවත්, ග්‍රාමසේවක මහතා හමුවීමට පැමිණෙන කෙනාට පුද්ගලිකව ඒක තුළ කතා කිරීමට අපහසු බවත්, අනිත් නිලධාරීත් එහෙම බවත්, ඒ නිසා ඒ සඳහා වැඩි අවධානයක් සභාපතිතුමා යොමු කළොත් හොඳයි කියා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

02 (i) ගරු සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා.

ඇමුණුම් ලේඛනය v හි සඳහන් 2027 වර්ෂයේ අයවැය කාල සටහන සඳහා මහා සභා අනුමැතිය ලබා දීමට සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

02 (ii) ගරු සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා.

1995 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ගෙවල් කුලී තැනපත් වශයෙන් ඇහැලියගොඩ ගුණතිලක මුද්‍රණාලය P.A.ගුණතිලක නමින් තැන්පත් කර ඇති රුපියල් 109680.00 මුදල 2024 වර්ෂයේ දී ආදායමට බැර කර ඇත. අවිස්සාවේල්ල දිසා අධිකරණයේ අංක 26602 දරණ ඉඩම් නඩුවේ තීන්දුව ප්‍රකාරව එහි අයිතිය හා නිරවුල් භුක්තිය තහවුරු වී ඇති බැවින්, මෙම මුදල සඳහා හිමිකම් කියන එම්.යූ.එම්.එම්.ෆසිල් ජිෆරි මයා විසින් ඉල්ලා ඇති බැවින් එම මුදල සමුච්චිත අරමුදලෙන් ගෙවීමට අනුමැතිය දීමට යෝජනා කරමි

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

02 (iii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව සඳහා අලුතින් බැකෝ ලෝඩර් යන්ත්‍රයක් මිලදී ගැනීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

කලින් එකක් සභාවේ ඒකමතිකව අනුමත කළ බවත්, නමුත් ඒකට යන මුදල වැඩි නිසා රීකන්ඩිෂන් එකක් හැටියට අනුමත කරලා ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යැවූ බවත්, රජයේ ප්‍රතිපත්තියක් විදිහට රීකන්ඩිෂන් වලට අනුමැතිය ලබා නොදෙන බවත්, එම නිසා මේ වෙලාවේ අලුතින් (බ්‍රෑන්ඩ් නිව්) බැකෝ යන්ත්‍රයක් ලබා ගැනිමට යෝජනා වූ බවත්, මෙහි සඳහන්ව ඇත්තේ බැකෝ ලෝඩර් කියා බවත්, මෙය බැකෝ යන්ත්‍රයක් ලෙස සංශෝධනය විය යුතු බවත්, ලෝඩර්යෙන් ලෝඩර් කරන්න විතරක් පුළුවන් බවත්, ඒ පිළිබඳව දන්න කෙනෙක් නිර්වචනය කරන ලෙසත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ලෝඩර ලෙස හඳුන්වන්නේ පටවන එක විතරයි. JCB යන්ත්‍රයකින් මොඩ්ල් එකේ බැකෝ කියලා වෙනම යන බවත්, එස්කැවේටර් කියලා වෙනම තියෙන බවත්, JCB කියන එක බ්‍රෑන්ඩ් එකක් බවත්, JCB යන්ත්‍රයක් සභාව අවශ්‍ය බවත්, කසළ අංගනයේ කාර්යයට අමතරව ගම්මානවල තියෙන මංමාවත් අලුතින් කපන්න තිබෙන බවත්, ඒ සඳහා යොදා ගත හැකි බවත්, උදාහරණයක් ලෙස දෙහිඕවිට ප්‍රාදේශිය සභාවේ එකක් තිබෙන බවත්, ඔවුන් පිට වැඩත් කරන බවත්, සභාවට ආදායමකුත් ගන්න පුළුවන් බවත්, එම නිසා මෙය බැකෝ යන්ත්‍රයක් ලෙස මිලදි ගැනිමට සුදුසු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී. වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

යෝජනාව කාලෝචිත යෝජනාවක් බවත්, සභාවට තියෙන ලොකුම අඩුපාඩුවක් බවත්, බැකෝ ලෝඩරයට වඩා ස්කැවේටරයක් හොඳයි කියා තමා හිතන බවත්, කසළ අංගනයටත් පිටින් ගන්න එස්කැවේටර් සඳහා ලොකු වියදමක් යන බවත්, සාමාන්‍යයෙන් බැකෝ යන්ත්‍රයකට වඩා සභාවට අවශ්‍ය එස්කැවේටරයක් බවත්, බැකෝ එකකින් කරන කාර්ය ස්කැවේටරයකින් කරන්න පුළුවන් බවත්. පිටට දීල සභාවට ආදායමක් උත්පාදනය කර ගත හැකි බවත්, ඒ නිසා බැකෝ යන්ත්‍රයකට වඩා සභාවට ගොඩක්ම වැදගත් වෙන්නේ කසළ අංගනයේ තියෙන වැඩ ටික කර ගැනීම සඳහා ස්කැවේටර් යන්ත්‍රයක් බවත්, එස්කැවේටරයක් සභාවට ගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.**

මේ පිළිබඳව අපි විශේෂයෙන්ම සාකච්ඡා කළ බවත්, මෙහි යෝජනාවක් තියෙන්නේ දැනට තියෙන ෆෝටෝන් (Foton) එකත් නවීකරණය කරලා, ඒය කසළ අංගනයට ලබා දිය යුතු බවත්, එවිට ගොඩක් අයගේ තීරණයක් ආවේ, එස්කැවේටරය ගෙනියන්න තව ලොරියකුත් ඕන වෙන බවත්, ඉදිරියේදී ආපදා තත්වත් එන බවත්, එමනිසා ගොඩක් වැඩිපුර අයගේ ඉල්ලීමක් තියෙන්නේ, JCB මොඩ්ල් නිසා සභාවට තව ආදායමකුත් ගන්න පුළුවන් නිසා බැකෝ ලෝඩර් එක යෝජනා කළ බවත්, සභාවේ ඒ ගැන තීරණයක් ගමු යනුවෙන් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මේ සඳහා ප්‍රතිපාදන හම්බවෙන්නේ කොහොමද. 2026 වර්ෂයේ සභා අරමුදලින් ද නැත්නම් මේ වසරේ සභා අරමුදලින් වෙන් කරනවද? යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.**

ගරු මන්ත්‍රීතුමා, සභාවට පසුගිය වසරවල විශාල මුද්දර ගාස්තු ආදායම් ප්‍රමාණයක් ලැබීමට තිබෙන බවත්, අදත් ඒ සඳහා මධුර මහතා ධාවනය කරන සුදු කැබ් රථය ගිය බවත්, එම නිසා සභාවට ඒවායින් මුදලක් ලැබෙයි කියලා ලොකු විශ්වාසයක් තිබෙන බවත්, එයින් ආයෝජනයක් ලෙස, බැකෝ ලෝඩරයක් ගැනිමට කටයුතු කරන බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, එය සභාවට දැනුම් දෙන්න වෙන බවත්, එය අයවැය ලේඛනයට අමතරව සභාවට ලැබෙන මුදලකින් මෙම බැකෝ ලෝඩරය ලබා ගන්නා බවට සභාපතිතුමා ප්‍රකාශ කරන බවත්, JCB යන්ත්‍රයක සාමාන්‍ය මුදලේ පරාසය පිළිබඳව අවබෝධයක් තියෙද යන්නත්, පළමු මුදල් කමිටුවේ මේ ගැන සාකච්ඡා කළ බව මතක බවත්, පළමු මුදල් කමිටුවේදීත් ලක්ෂ 15ක් කසළ අංගනයේ වැඩ කරන්න ඉල්ලු බවත්, එහෙම හරියන්නැති බවත් ඒ කාර්ය සිදු කිරිමට ස්කැවේටර් යන්ත්‍රයක් ලබා ගැනිම සුදුසු බව එදින ප්‍රකාශ කළ බවත්, එම නිසා යෝජනාව නිශ්චිත කර ගෙන සභාවේ අනුමැතිය ලබා ගත යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ෆෝටෝන් එක තියෙන බැවින්, නැවත තව බැකෝ යන්ත්‍රයක් ගත්තොත් බැකෝ දෙකක් බවත්, ඒ නිසා එස්කැවේටරයකින් ඕන තැනක යන්න පුළුවන් බවත්, එස්කැවේටරයක් ගැනීම සුදුසු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා **විසින් ප්‍රකාශ කරන ලදී.**

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

එස්කැවේටරයට අපි වැඩිය අත තිබ්බේ නැත්තේ, අපිට තව එස්කැවේටරයක් ලබා දෙන බවට විශ්වාසයක් තිබෙන බවත්, යුධමය තත්වයත් එක්ක ප්‍රමාද වී තිබෙන බවත්, දැනට ඇනවුම් කලා කියලත් ආරංචියක් තිබෙන බවත්, එස්කැවේටරයක් හම්බවෙයි කියලා ලොකු විශ්වාසයක් තියෙන නිසා බැකෝ ලෝඩරයක් ගැනීම සඳහා විශේෂයෙන්ම යෝජනා කළ බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා පෙ.ව 10.15 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, පළමු සහ දෙවන සභා වාරයේදී සභාපතිතුමා සහ උපසභාපතිතුමා කතා කළා ආණ්ඩුකාරතුමිය අපිට පරිත්‍යාග කරනවා කියලා. එහෙම අපිට හම්බවෙනවා නම් සභාවෙන් අපි සාකච්චා කර සුදුසු තීරණයක් ගමු යැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

ඇත්තට ම අපි සභාවට ඇවිල්ලා මාස කිහිපයක් ඇතුළත ගරු ආණ්ඩුකාරතුමිය හමුවෙලා බැකෝ යන්ත්‍රයක් සහ එස්කැවේටර් යන්ත්‍රයක් සඳහා පරිපූරකයකින් ඉල්ලූ බවත්, මේ අවුරුද්දේ පළාත් පාලන ආයතනවල වාහන අවශ්‍යතා දන්වල යැවූ බවත්, ඒ වාහන ටික ඉදිරියේදී ලැබෙයි කියලා විශ්වාසයක් තිබෙන බවත්, මේවන විට අලුතින් එකක් සභාවට තිබුණොත් හොඳයි කියා සිතන බවත්, එවිට කසළ අංගනයට එකක් යොදවල, අනික ගම්බද හැම වසමකම කාණු ගොඩවෙලා, ඒවා සුද්ද කරලා අපිට ලොකු වැඩ ටිකක් කරන්න පුළුවන් බවත්, මෙය නිශ්කාර්ය වියදමක් නොවන බවත්, මේ වසරේ අයවැයට පිටින් ලැබෙන්න තියෙන මුදලින් මෙය මිල දී ගන්න පුළුවන් බවත්, විවිධ බැකෝ යන්ත්‍ර තිබෙන බවත්, ජේසීබී, කැට්, ෆෝටෝන් වගේ විවිධ වර්ග තිබෙන බවත්, අලුතින් එකක් ගත්තොත් කැටපිලර්වල මිල ලක්ෂ 300ත් 400ත් අතර.JCB ලක්ෂ 220-350ත් අතර තියෙන බවත්, බැකෝ යන්ත්‍රයක් ගත්තොත් අපිට ලොකු වැඩ ටිකක් කරන්න පුළුවන් බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා පෙ.ව 10.20 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී **එන්.එල්. රුවන්සිරි විමලරත්න මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මාලින්ද මන්ත්‍රීතුමාගේ යෝජනාවට තමා විරුද්ධ වෙනවා නෙවෙයි. 2017 වසරේ නාය ගිය ස්ථානත් සුද්ද කිරීමට තවමත් තිබෙන බවත්, ආපදා තත්ව හදිසියේ පැමිණෙන බවත්, එවැනි තැන්වලට ගෙන්න ගන්න පුළුවන් වාහනයක් සුදුසු බවත්, ඒ සඳහා වඩාත් සුදුසු වන්නේ බැකෝ ලෝඩර් යන්ත්‍රයක් බවත්, එම නිසා බැකෝ ලෝඩර් යන්ත්‍රයක් සුදුසු බවට තමන් යෝජනා කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්. රුවන්සිරි විමලරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා පෙ.ව 10.22 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ගොඩක් දුරට ගියපාර දිට්ඨා ආපදා තත්වය යටතේ, සභාවක් විදිහට අපහසුතාවයටත් පත්වුණ බවත්, ඇහැලියගොඩ වත්තේ නාය ගිය ගිය බවත්, ඒ පස් ගොඩ තවමත් තිබෙන බවත්, ගොඩක් අය හිතන් ඉන්නේ සභාවේ බැකෝ යන්ත්‍රයක් පවතින බවත්, සභාවේ එහෙම එකක් තිබුණා නම් ලොකු පහසුවක් වෙන බවත්, ඒ පිළිබඳවත් හිතා සභාවේ හැමෝටම ප්‍රයෝජනවත් විදිහට යෝජනාව දැමූ බවත්, මේ සඳහා ගොඩක් අය කැමති බවත්, නමුත් එස්කැවේටරයද බැකෝ ලෝඩරයද කියන දෙය තිරණය කර ගත යුතු බවත්, ගරු මාලින්ද මන්ත්‍රීතුමානි, ගොඩක්ම ඉදිරියේදී අපිට නායයෑම් එහෙම එන හින්දා බැකෝ ලෝඩරය, අවශ්‍ය තැනට ඉක්මනින් ගෙනියන්න පුළුවන් බවත්, සුදුසු තීරණයක් ගන්නා ලෙසත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා

ගරු සභාපතිතුමනි, ඒක ගැටළුවක් නොවන බවත්, වැඩි කැමැත්තට ඉඩ ලබා දෙන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා පෙ.ව 10.25 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ඒ යෝජනාවම තමන් යෝජනා කරන්න බලාපොරොත්තු වූ බවත්, බැකෝ ලෝඩර් යන්ත්‍රයක අවශ්‍යතාවය දැඩිව තිබෙන බවත්, පාරවල් නැවත අලුතින් සැකසන මාර්ග සඳහා සභාවේ බැකෝ

ලෝඩරයක් තිබේද යන්න ජනතාව ප්‍රශ්න කරන බවත්, එස්කැවේටරය ප්‍රවාහනය කිරීමේ ගැටලුවක් පවතින බවත්, ඊට වඩා බැකෝ ලෝඩරයක අවශ්‍යතාවය තිබෙන බවත්, ගරු ප්‍රාදේශීය සභා කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **ඩබ්.එම්.අමිල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, ගැටළුවක් නොවන විදිහට බ්‍රෑන්ඩ් එක් බලලා බැකෝ ලෝඩරයක් ගැනිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **ඩබ්.එම්.**අමිල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

02 (iv) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට කසල එකතු කිරීම කාර්ය සඳහා යොදවා ගැනීමට ට්‍රැක්ටර් ටේලර් රථයක් මිලදී ගැනිමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමිල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

සභාවට මෑත කාලයේදීත් ට්‍රැක්ටර් රථයක් ලැබුණ බවත්, එය මේවන විට භාවිතයේ පවතින බවත්, සභාවට ලොකු ප්‍රතිපාදනයක් පළාත් සභාවෙන් ලැබුණ බවත්, සභාවෙනුත් ඒකට තව අමතර මුදලක් එකතු කරන්න සිදු වුණ බවත්, සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් එය දන්නව ඇති බවත්, අවුරුදු ගාණක පරණ ටේලර් පවතින බවත්. ගොඩක් ඒවා දැන් දුර්වල ඒවා බවත්. ගත්තු එක මේ වන විට හොඳට වැඩ කරන බවත්, ඇලුමිනියම් වැට සඳා ඇති බවත්, එවැනි ට්‍රේලර් රථයක් මිලදි ගැනීම සුදුසු බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, එය ගොඩක් කාලෝචිත යෝජනාවක් බවත්, පවතින ටේලර් රථවල කුණු ප්‍රවාහනය කිරිමේ දී ඒවා බිමට වැටෙන බවත්, රාමුවත් ක්‍රමානුකූලව සකස් කර එම ටේලර් රථ ක්‍රමවත්ව කුණු එකතු කිරීමට හැකි ආකාරයට සකස් කර ගන්න පුළුවන් හැකි නම් එය වටින බවත්, එවිට වැඩි කසළ ප්‍රමාණයක් ප්‍රවාහනය කිරිමට හැකි බවත්, එවිට පාර යන විට කසල වැටෙන ප්‍රමාණයත් අඩුකර ගන්න පුළුවන් බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ටේලර් රථ අලුත්වැඩියා කිරීම සඳහා මේ වන විට ටෙන්ඩර් කැඳවා තිබෙන බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

02 (v) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අයත් ZA 5083 බැකෝ යන්ත්‍රය අලුත් වැඩියා කිරීම සඳහා Foton දේශීය නියෝජිත ආයතනය වන ඇවොන්ස්මාර්ට් ඉන්ජිනියරින් පුද්ගලික සමාගම විසින් යන්ත්‍රය පරීක්ෂා කර ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව පරිදි රුපියල් 1,962,900.72 ක මුදල ගෙවීම් කර අදාළ අලුත්වැඩියාව සිදු කරවා ගැනීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මෙය Foton බැකෝ යන්ත්‍රයක් බවත්, මෙය වසර ගණනාවක සිට සභාව සතුව තිබෙන බවත්, මෙයට වැය වන මුදලත් සමඟ පසුගිය කාලයේ මෙය සාදා තේරුමක් නැහැ කියලා අත හැර දැමූ බවත්, ලේකම්තුමත් සාක්ෂි දරන බවත්, අනික් මන්ත්‍රීවරු ඒ ගන දන්නා බවත්, කෑගල්ල පළාත් සභාවේත් තියෙන බවත්, මේක හොඳට වැඩ කරන බවත්, අලුතින් එකක් ගන්න ගියොත් විශාල මුදලක් වැය වෙන බැවින් මෙම ආයතනය මේ මුදලට මේක කරලා දෙන්න පොරොන්දු වෙලා තියෙන බවත්, මෙහි යන්ත්‍ර ක්‍රියාකරුවෙක් ලෙස සෞඛ්‍ය කම්කරු මහතෙක් මේ කාර්යය පසුගිය කාලයේ සිදු කර තිබෙන බවත්, මේක හරියට හදා ගත්තොත්, ඉතා වටිනා බවත්, අනිත් ඒවත් එක්ක බලද්දී අපිට මේක තියෙන දෙයක්නේ. මේක ඇත්තටම අපහරණය කරන්න ගියොත් මේ ක්‍රමවේදය යටතේ, අවුරුද්දක පමණ කාලයක් යන බවත්. එම නිසා මේක දුන්නා කියලා වෙන ප්‍රතිපාදනයක් ලැබෙන් නැති බවත්, ඒ නිසා මෙය සදා ගැනිම සුදුසු බවට යෝජනා කරන බවත්, මෙය සභාවට තියෙන වත්කමක් බවත්, මේක තමන් පුද්ගලිකවත් ඔපරේටර් කෙනෙක් එක්ක ගිහිල්ලා ක්‍රියා කිරීමට උත්සාහ කළ බවත්, බැටරියත් මාරු කර දැමූ පසු ස්ටාර්ට් වුණ බවත්, එම නිසා ලොකු වියදමක් යන එකක් නැති බවත්, ඒ නිසා ඒක අලුත්වැඩියා කරන්න අදහස් කළ බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

පිටුපස බක්කිය සහ ඉදිරිපස බක්කිය කියලා 02ක් තිබෙන බවත්, හයිඩ්‍රොලික් සිස්ටම් එකේ ප්‍රශ්නය තිබෙන බවත්, මීට කලින් අලුත්වැඩියා කර ඔයිල් ලීක් වුණ නිසා නවතා තබා ඇති බවත්, නිකන් තියෙන නිසාම වාහනේ තව නැති ප්‍රශ්න එන බවත්, එම නිසා මේක අපේ වත්කමක් බවත්, මෙය ලොකු වටිනාකමක් තියෙන එකක් බවත්, එමනිසා අපිට මේක අලුත්වැඩියා කරලා ප්‍රයෝජනයට ගන්න පුළුවන් බවත්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට දිට්ඨා සුළි කුණාටු වෙලාවේ ගිය බවත්, තව ප්‍රාදේශීය සභාවල තියෙන ඒවා .මේවා හරියට භාවිතා කළොත් ලොකු ප්‍රයෝජනයක් ගන්න පුළුවන් බවත් එම නිසා අපි මේක නිසි ක්‍රමවේදය යටතේ අලුත්වැඩියා කරලා, ඒකට අදාළ සුදුසු කෙනෙක් පත්කරලා, භාවිතා කළහොත් ගැටලු ඇතිවෙන එකක් නැති බවත් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා පෙ.ව 10.33 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **එච්.ආරියදාස මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මේ ආයතනයේ තියෙන මේ වගේ සම්පත් පසුගිය කාලයේ පරිහරණය කරපු ආකාරය නිසා, ගොඩාක් දුරට මේවා පැත්තකට වෙලා තිබෙන බවත්, දැනුත් සමහර තැන්වල මේවට සුදුසු පුද්ගලයින් මේවා පරිහරණය කරන්නේ නැති බවක් දකින්න තිබෙන බවත්, වාහන පවදවීමට ඒකට සුදුසු පුද්ගලයින් සිටිය යුතු බවත්, ඒ සඳහා සුදුසු පුද්ගලයින් සිටිය යුතු බවත්, කුණු අදින ට්‍රැක්ටරයේ පවා පසුගිය කාලේ නුපුහුණු අය මේවා පරිහරණය කරන බවත්, බැකෝ යන්ත්‍රයත් අවුරුදු ගාණක් මොකක් හරි දෙයක් බවත්, සභාපතිතුමාට වාහන පිළිබඳව දැනුමක් තියෙන නිසා, ඒවා පිළිබඳව අධ්‍යයනය කරන්න ලේසියි බවත්, එම නිසා මේ තියෙන සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගත යුතු බවත්, මේවාට වියදමක් දරලා හරි කොහොම හරි හදා ගත යුතු බවත්, මේවා පසුව යකඩවලට එහාට මෙහාට වෙන්න ඉඩ නොහැරිය යුතු බවත්,

ලේකම්තුමත් මේ වෙලාවේ උනන්දුවෙන් වැඩ කරන නිසා මේ තියෙන ඒවා හදාගෙන මෙයින් ප්‍රයෝජන ගැනීම කළ යුතු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී **එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.**

ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

02 (vi) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මාස 03 න් 03 න් සේවය බණ්ඩනය වන පරිදි තත්කාර්ය පදනම මත සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා සේවය යොදවා ගෙන ඇති W.L.A. සුසන්ත මයා සමඟ එළඹි සේවා ගිවිසුම 2026 .05.28 දින සිට මාස 03 න් තුනට අලුත් වන පරිදි 2026 වර්ෂය සඳහා ගිවිසුම්ගත වීමට හා රාජ්‍ය පරිපාලන චක්‍රෙල්බ 10/2025 හි අනු අංක 16 පරිදි වේතන ගෙවීමටත් යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී **ටී.ඞී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා** විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, , මාස 03 න් 03 න් සේවය බණ්ඩනය වන පරිදි තත්ත්කාර්ය පදනමයි.දැන් ඒ සේවක මහත්මයා පිහිටුවන්න යන මාස 03න් 03ට අලුත්වන පරිදි ගිවිසුම්ගත වීමේ ඒ ක්‍රමවේදය මොනවගේ කාරණාවක්ද යන්න දැන ගැනිමට අවශ්‍ය බවත්, ඒකෙ වාසි අවාසි මොනවාද යන්නත්, මාස 03න් 03ට බණ්ඩනය වෙන එකෙයි ,මාස 03න් 03ට ගිවිසුම්ගත වෙන එකෙයි බැලූ බැල්මට වෙනසක් පේන්නේ නැති බවත්, තත්කාර්ය පදනම කියන්නේ, 10/2025 හි අනු අංක 16 කියන්නේ අලුත් එකක්ද යන්නත්, තත්කාර්ය පදනමින් ඒ අනු අංක 16 වෙනස් වෙන්නේ කොහොමද යන්නත්, දැන ගැනීමට අවශ්‍ය බවත්.05 **(vi)** ත් එවැනිම යෝජනාවක් තිබෙන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා **විසින් කරුණු විමසන ලදී.**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා පෙ.ව 10.37 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඒ සම්බන්ධව සභා ලේකම්තුමාගෙන් කරුණු විමසීම සඳහා මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙසට ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් සභාවෙන් ඉල්ලා සිටින ලදී.

ඒ අනුව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් සභාව කාරක සභාවක් කිරිමට යෝජනා කළ අතර,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඞී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ඒම යෝජනාව ස්ථිර කරන ලදී.

සභා ලේකම්තුමා විසින් 02 (vi) යෝජනාවට අදාළව කරුණු පැහැදිලි කරන ලදී.

උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් කාරක සභාව මහා සභාවක් කිරිමට යෝජනා කළ අතර,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ඒම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

03 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිනිය.

බොරළුව රුවන් මහතාගේ නිවස අසල සිට පොදු ළිඳ දක්වා මාර්ග කොටසසේ වම්පස කොටස මීටර් 50 ක් පමණ කොන්ක්‍රිට් අතුරා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී **එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිනිය පෙ.ව 10.40 ට සභා ගර්භයෙන් පිට විය.

03 (ii) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිනිය.

බොරළුව රුවන් මහතාගේ නිවස අසල සිට දකුණු පස මාර්ගයේ මීටර් 50 ක් පමණ කොන්ක්‍රිට් කිරිම සඳහා යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

03 (iii) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිනිය.

නාගොඩ සුද්දගෙ වත්ත මාර්ගයේ කොස්ගහ අසල බුදුමැදුර ළඟ සිට තුෂාර මහතාගේ නිවස අසලට කොන්ක්‍රිට් කර සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

04 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා.

ඇහැලියගොඩවත්ත නව ගම්මානයට පිවිසෙන හා පිටවන මාර්ගවල බෝක්කු දෙක සකස් කර මාර්ගය කොන්ක්‍රිට් කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා පෙ.ව 10.42 ට සභා ගර්භයෙන් පිට විය.

04 (ii) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා.

ඇහැලියගොඩ පල්ලිය පිටුපස තනිපොල්ගහවත්තට යන මාර්ගය කාණු පද්ධතිය සැකසිමට යෝජනා කරමි. (මෙය අස්ගගුල පල්ලිය ලෙස නිවරදි විය යුතුය.)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි,මෙය ඉතා වැදගත් යෝජනාවක් බවත්, ඊට එහා පැත්තේ තව බෝක්කුවක් තිබෙන බවත්, එම බෝක්කුව සඳහා ද අවධානය යොමු කරන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී **දිලීන් කරුණාපාල මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මුන්සීර් මන්ත්‍රීතුමාගේ යෝජනාවට විරුද්ධ නොවන බවත්, මෙය සංවර්ධන යෝජනාවක් ලෙස දකින බවත්, සංවර්ධන යෝජනා දැමීම සම්බන්ධව තිරණයක් ගත් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.
අයවැයට තියෙන යෝජනා ටික කර පසුව ඊළඟට දාන බවත්, යෝජනා පෙළ ගස්සන කොට ප්‍රමුඛත්වය දිමට සිදු වන බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

04 (iii) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා.

ඇහැලියගොඩවත්ත නො. 02 කොටසෙහි ෆමිල් මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි. (ෆමිල් මහතා කියන නම ෂර්මිලන් මහතා ලෙස නිවැරදි විය යුතුයි. )

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමිල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, සංවර්ධන යෝජනා ඉදිරිපත් වීම සිදු වෙන්න අවශ්‍ය බවත්, නමුත් ඒ සඳහා ඉදිරියේදී ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද යන්නත්, නිශ්චිත පිළිතුරක් අවශ්‍ය බවත්, මින් ඉදිරියට ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍ය බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, තමන් එදත් කිව්වේ සංවර්ධන යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න අවස්ථාව ලබාදෙන්න යන්නත්, මන්ත්‍රීතුමන්ලගේ මන්ත්‍රීතුමියන්ලගේ සංවර්ධන යෝජනා මෙම න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති බවත්, එය ඉතාමත් ම හොඳ බවත්, අපිටත් ඒ අවස්ථාව ලබාදෙන්න කියන ඉල්ලීම කරන බවත්, එවිට යෝජනාව දාල තියෙන්නේ කියලා ගමට ගිහින් කියන්න පුළුවන් බවත්, නමුත් මේක කරන්න සභාවේ සල්ලි නෑ කියලා.සල්ලි හම්බුනාම කරන්නම් කියලා.ඒ නිසා අපිටත් ගමේ මන්ත්‍රීවරයෙක් විදිහට ගමට මුහුණ දෙන්න අවශ්‍ය බවත්, එවිට ඒ අවස්ථාව තිබෙන බවත්, ඒ නිසා න්‍යාය පත්‍රයට යෝජනා දැම්මට අවස්ථාව දෙන්න ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ඉල්ලිමක් කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා පෙ.ව 10.45 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය පෙ.ව 10.45 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මේක ඔබතුමාගේ දැනුවත් කිරීමකින් තොරව වුණු දෙයක් කියලා තමා සිතන බවත්, මෙතෙන්දි තමන්ගේ බලවත් කණගාටුව ප්‍රකාශ කරන බවත්, තමා ද එවැනි යෝජනා දෙකක් 04 වෙනි මාසයේ සභාවට දැමූ බවත්, නමුත් ඒ සම්බන්ධව ඔබතුමා අත්සනින් ලියුමක් ලැබුණු බවත්, මෙතනදී තමන් විසින් ගරු ලේකම්තුමාව දැඩිව විවේචනය කරන බවත්, මොකද ලේකම්තුමා තමයි මේක අයින් කළේ. ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ කියලා නැහැ. අපේ යෝජනාත් දාන්න ඕන බවත්, ගරු ලේකම්තුමා. තරහ වෙන්න එපා කිවුවට.අපි දෙන යෝජනා ඔබතුමාට බැහැ අයින් කරන්න. එහෙම කරන්න එපා. මේකෙ ඉන්නේ සියලු දෙනාම කුමන හෝ පක්ෂයක මන්ත්‍රීලා බවත්, අපි සියලු දෙනාම මන්ත්‍රීවරු. මේක අයින් කළේ ඇයි කියලා දැන ගන්න අවශ්‍ය බවත්, මේ ආණ්ඩු පක්ෂයේ අයගේ ඒව දාන්න පුළුවන් නම් ,ඇයි විපක්ෂයේ කට්ටියගේ ඒවා දාන්න බැරි. මේකට අනිවාර්යයෙන් ලිඛිතව ලියුමක් මඟින් මෙන්න මේ අයගේ ඒවා දානවා. මේ අයගේ ඒවා දාන්නේ නැහැ කියලා. අනිවාර්යයෙන් ලියුමක් අවශ්‍ය බවත්, සභාපතිතුමා තරහා වෙන්න එපා. ආණ්ඩු පක්ෂය විපක්ෂය කියලා නැහැ. අපි මහජන නියෝජිතයින් හැමදෙනාම. ඒ නිසා මේකට අනිවාර්යයෙන්ම ලිඛිතව ලියුමක් දෙන්න. මේ දේ නිසා තමයි මගේ එක අයින් කළේ කියලා. තමන් යෝජනා කළේ මීටර් 50 කොටස් දෙකක් සකසා ගැනීමට බවත්, ඒ යෝජනා දෙකම ජාතික ජනබලවේගයට වැඩ කළ ගමේ අයගේ පාරවල් දෙකක් බවත්, ආරියදාස මන්ත්‍රිතුමාටත් තමා යෝජනා කළ යෝජනා දෙක ලැබීමට සලස්වන බවත්, තමන්ගේ නම හන්වඩු ගසා ගැනීමට මෙවැනි යෝජනා ඉදිරිපත් නොකරන බවත්, ගමට සේවාවක් වෙන්න ඕන නිසා යෝජනා ඉදිරිපත් කළ බවත්, ඒ නිසා ගරු සභාපතිතුමා මේගොල්ලන්ගෙ ටික දාන්නත් අපේ ටික නොදාන්නත් හේතුව මට ලිඛිතව ලියුමක් මඟින් දැන ගැනීමට අවශ්‍ය බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, කාරණය පැහැදිලියි බවත්.අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපිට සංවර්ධනය කළ යුතු ස්ථාන, සංවර්ධනය කලයුතු කාරණා, සංවර්ධනය කළ යුතු මාර්ග විශාල ප්‍රමාණයක් තිබෙන බවත්, මේ දේවල් අපිට ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන වලින් විතරක් අපිට මේක කරන්න බැරි බවත්, එදා අපි ඒකාබද්ධ කාරක සභාවෙදිත් පැහැදිලි කළේ ඒ ගැන බවත්, ඒකට සභාවට විවිධ මූල්‍ය ප්‍රතිපාදන අමාත්‍යාංශ වලින් ලැබෙන බවත්, ලබන අවුරුද්ද සඳහා ග්‍රාමීය මාර්ග වලට යෝජනා මේ අවුරුද්දේ එවන්න කියලා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයාගේ කාර්යාලයට ලිපියක් ලැබිලා තිබුණ බවත්, ඒ සඳහා ,සියලුම කොට්ඨාශ මන්ත්‍රීවරුන් ගෙන් ඒ යෝජනා ටික ගන්න බවත්, ඒ නිසා ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන වලින් විතරක් මේ සියල්ල කරන්න බැරි බවත්. ඒ නිසා අපිට අමාත්‍යාංශ ප්‍රතිපාදන, පළාත් සභා ප්‍රතිපාදන, වෙනත් විදේශ ආධාරවලින් කරන ප්‍රතිපාදන වලින් මේ දේවල් කළ යුතු බවත්, ප්‍රාදේශීය සභාව ගත්තොත් අයවැය වෙන් කරගෙන තියෙන මුදල්වලින් මේවා කර ගත යුතු බවත්, ඒවා පදනම් කරගෙන තමයි කරන්න පුළුවන් දේවල් කළ යුත්තේ. ඒ නිසා මමත් ඇතුලු අපි සියලු දෙනා,මතක තියාගන්න ඕනි දෙයක් අපිට කොපමණ ප්‍රමාණයක්ද කරන්න පුළුවන් කියලා. ඒ නිසා අපි හැමෝම සාකච්චා කරගෙන එකඟතාවයකට ආවා,මේ සම්බන්ධයෙන් ගත්තොත් ඔබතුමා න්‍යාය පත්‍රයට මැදිහත් වෙන්න.ඔබතුමාට අයිතිය තියෙනවා, මෙය මේ වසරේ මූල්‍ය ප්‍රතිපාදන වෙන්කල නොහැකි කටයුත්තක් බැවින්, න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සිදු කළ නොහැක කියලා,ඕනෑම මන්ත්‍රීවරයෙක්ගේ යෝජනාවක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය තියෙනවා. ඒ නිසා බලය පාවිච්චි කරන්න. එහෙම කරලා අපි මේක විධිමත්ව පවත්වාගෙන යමු.ඇත්තටම මේක නිලධාරී මණ්ඩලයවත්, ඔබතුමාගෙවත් වැරැද්දක් නොවයි.අපේ බල ප්‍රදේශයේ කළ යුතු ,අත්‍යවශ්‍ය යෝජනා ගොඩාක් තිබෙන බවත්.මම කිව්වේ කලින් සමහර පාරවල් වල කාණුව නැති නිසා බැකෝ යන්ත්‍රයක් තිබ්බනම් අපිට පාරවල් සුද්ද කරගන්න තිබුණා. ඇත්තටම ගත්තොත් කාණුව සිමෙන්ති වලින් බැන්දත් ,ඒ සිමෙන්ති දාපු කාණුවේ වැලි ගොඩ ගැහුනට පස්සේ, මිනිස්සු ඒවා අයින් කරගන්නෙත් නැහැ. ජනතා සහභාගිත්වයත් මේකට අවශ්‍යයි. මේ සියලුම දේ ප්‍රාදේශීය සභාවෙන් කරන්න අපහසු බවත්, ඒනිසා අමාත්‍යාංශ ප්‍රතිපාදන ඒ දේවල් ගන්න ඕන බවත්.ඒ නිසා අපි ප්‍රාදේශීය සභාවෙන් කළ හැකි දේ ගැන අවබෝධයක් අරගෙන ඒ දේවලුත් කරලා, සභාව විධිමත්ව පවත්වාගෙන යායුතු බවත්, ඒ සඳහා ඔබතුමාට

බලය තියෙනවා. ඔබතුමාට ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය තියෙනවා. ඒ නිසා අපි ඒ විදිහට පවත්වාගෙන යමු. අපිට දක්ෂ ලේකම්වරයෙක් ලැබිලා තිබෙන බවත්, එතුමාගේ උපදෙස් අනුව අපි මේ සභාව වඩාත් නිවැරදිව, වඩාත් කාර්යක්ෂමව අනවශ්‍ය සංවාද සහ අනවශ්‍ය ගැටුම් වලට ඉඩකඩ නොදී අපි සභාව පවත්වාගෙන යා යුතු බව අවධාරණය කරමින් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා පෙ.ව 10.45 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

සභාපති හැටියට මම නියෝජනය කරන්නේ සියලුම පක්ෂ සහ සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීවරියන් බවත්, ඒ නිසා ඉදිරියේදී අපි යෝජනා දානව නම්, එහෙම කිහිප දෙනෙක්ගේ ඒවා නොදා ඉන්නත් බැරි බවත්, ඒ නිසා එහෙම යෝජනා දානව නම් හැමෝගෙම යෝජනා දාන්නත්, නැත්නම් හැමෝගෙම ඒවා නොදා ඉන්නත් තමන් පොරොන්දු වන බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. නැත්නම් තාවකාලිකව නොදා ඉමු බවත්, ඒක පක්ෂද විපක්ෂද බලලා එහෙම අයවැයට යොමු කරලා තියෙන මුදලත් බලලා, කාලයේ අවශ්‍යතාවයත් බලලා වැඩ කරන්න ඕන බවත්, සභාපති හැටියට තමාගේ අවසාන තීරණය යෝජනා දාන්න පුළුවන් අය යෝජනා ඉදිරිපත් කරන ලෙසත්, එය තමාගේ පුද්ගලික තීරණය බවත්, අයවැයට වෙන් කර ඇති මුදල හා කාර්යක්ෂමතාවත් බලා සභාවේ තීරණය කොහොමද කියලා ප්‍රකාශ කරන ලෙසත් මෙහිදී ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා පෙ.ව 10.50 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, කාරක සභාවට සියලුම මන්තිවරුන් කැඳ වූ බවත්, එහිදි යම් තිරණයක් ගත් බවත්,ගරු මාලින්ද මන්ත්‍රිතුමාට එවා ඇති ලිපියේ "සංවර්ධන යෝජනා ප්‍රගතිය,ප්‍රමුඛතා හඳුනා ගැනිම මුදල් රෙගුලාසි හා ක්‍රමවේදය...." යන ඡේදයන් ඔස්සේ ඒ පිළිබඳව විස්තර කර ඇති බවත්, එදා කාරක සභාවේ දී ඒ වර්ෂය සඳහා යෝජනා ඉදිරිපත් කළ මුදල් වලට සමානව යෝජනා ඉදිරිපත් කරන්න කියූ බවත්. විපක්ෂයක් වශයෙන් එදා කිවුවා හා ප්‍රශ්නයක් නැහැ එහෙම නම් හරි කියලා.අපි මේ මුන්සිර් මන්ත්‍රිතුමාගේ යෝජනාව ප්‍රතික්ෂේප නොකරන බවත්, එම යෝජනාව තමන් විසින් ස්ථිර නබ බවත්,එය තමන්ගේ කොට්ටාශය බවත්,විපක්ෂයෙන් නැත්නම් පක්ෂයේ මන්ත්‍රිවරු හරි යෝජනා දාලා කරන්න විපක්ෂයක් විදහට අපි සහයෝගය දීමට කැමති බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.ප්‍රකාශ කළේය.මෙම යෝජනා ඉදිරිපත් කිරීමේ නිර්නායක සහ මුදල් රෙගුලාසි හා ප්‍රතිපත්ති කාරණා දෙක යටතේ , මේ මුදල් මේ විදිහට වෙන්කර දෙන්න බැහැ එහෙම නම්.අපිට කිවුවා අපේ යෝජනා සියල්ල අයින් කර ගන්න කියූ බවත්, ඒකට වචනයක් කිවුවා මට ඒක මතක නහැ.ලේකම්තුමා කිවුවා .පරිච්චින්න කරනවා කියලා. එහෙම කරලා ඉවර වෙලා අපිට අලුතින් යෝජනාවක් දාන්න විපක්ෂයටත් මුදලක් ලැබුණ බවත්, ඒ මුදල ලබා දෙනකන් බලා සිටින බවත්, අපේ මුන්සීර් මන්ත්‍රීතුමා හරි කවුරු හරි කොට්ඨාශය දිනපු මන්ත්‍රීවරු විශාල වශයෙන් යෝජනා ගේන කොට තුන තුන.ඒ ටික කරලා වැඩේ කරමු. එතකොට ගැටලුවක් නැහැ.නැත්නම් අයෙ යෝජනා එනවා. එතකොට ලේකම්තුමා කියන විදිහට ලොකු ගැටළුවක් වෙනවා සභාවේ. ඒ නිසා අපි හැමෝටම අවධානය යොමු කරලා මේ කටයුත්තේ යෙදෙමු කියන එක තමයි තමන් කියන බවත්, මොකද නීතියකුත් තියෙනවා. ඒ නීතිය කියන රාමුව ඇතුළේ වැඩ කරන ක්‍රමවේදයකුත් තියෙනවා. දැන් ඒ හැඟීමට කතා කළා කියලා,ඒ දේ කරන්නත් බැහැ.ඒ නිසා අපි සියලු දෙනාම මේ මේක විද ගෙන වැඩ කරමු කියලා ප්‍රකාශ කරන බවත්, තමන් හැමදාම මම කියනවා වාක්‍යයක් ලිවීමේදී සහ ප්‍රකාශ කිරීමේදී එහි අර්ථය පැහැදිලි වන ආකාරයෙන් කටයුතු කරන්න.ඒ නොකරන හේතුව නිසා තමයි මේ විදිහට ගැටලු මතුවන්නේ කියන එක මම මේ සභාවෙදී ප්‍රකාශ කරනවා කියමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

ගරු සභාපතිතුමනි, දැන් ගියවර ප්‍රකාශ කළා ලක්ෂ එක හමාරක මුදලක් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ලබාදෙනවා කියලා ප්‍රකාශ කළ බවත්, මම අහන්න හැදුවේ අවිච්චින්න කරනවා කිවුවනේ යෝජනා.තමාද යෝජනා 11 ඉදිරිපත් කර ඇති බවට එදින ප්‍රකාශ කළ බවත්, එතකොට ඒ යෝජනා ටික ඔක්කොම ඉවත් වෙනවා. යෝජනා නෑ ඊට පස්සේ. ඒ දීල තියෙන යෝජනා එකකටවත් ප්‍රමාණවත් නැහැ ලැබෙන මුදල්. එවිට එතනදී මොකක්ද කරන්නේ යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී **පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් විමසිමක් කරන ලදී.**

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

එතන යම් ගැටලු ටිකක් තිබෙන බවත්,අවිච්චින්න කරන කතාව මට මතක නැති බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා පෙ.ව 10.55 ට සභා ගර්භයෙන් පිට විය

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

එතකොට ලැබෙන මුදලකින් කරන්න සෑහීමකට පත්වෙන්න බැහැ. එතකොට මොකක්ද කරන්නේ යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් විමසිමක් කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

එදින යෝජනාවක් කළ බවත්. තව ටිකක් කතා කරලා මොකක්ද කරන්නේ කොහොමද බෙදන්නේ කියලා, එහිත් ගැටලු සහගත ටිකක් තියෙනවා. අය වැයේ අපි මෙච්චරකල් කරපු යෝජනා ටික පිළිවෙළින් යමු කියලත් කතා වුණා. එතනදි හරියට එකමුතුවක් ආව් නැහැ මේක මන්ත්‍රීවරුන් ගානේ බෙදනවද එහෙම නැත්නම් මොකක්ද කරන්නේ කියලා තීරණයක් ගත්තේ නැහැ.පොඩ්ඩක් අපි අයෙත් සාකච්ඡාවක් කරන්න වෙයි තීරණයක් ගන්න. නිශ්චිතවම මෙන්න මේකයි කරන්නේ කියලා තීරණය කරන්න බැරි වෙයි. මම හිතන්නේ මීට වැඩිය අපි තව ටිකක් කතා කරලා මොකක්ද කරන්නේ ,අවිච්චින්න කරනවාද කියන්න ඇත්තටම අපි තීරණයක් ගත්තේ නැහැ. නැවත සාකච්වාවක් කරන්න වෙයි ඒ පිළිබඳව තීරණයක් ගන්න යනුවෙන් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා.

ගරු සභාපතිතුමනි, කාලය නාස්ති කරන නිසා මගේ පෞද්ගලික අදහසක් විදිහට කියන බවත්, දැනට මන්ත්‍රීවරයෙක්ට යෝජනා තියෙනවා නම් පෙර විදිහටම දාන්න.දැනට අපි අවශ්‍යතාවය අනුව ඒ කියන්නේ හැම එකක්ම නැතුව අපිට අත්‍යවශ්‍ය යෝජනා විතරක් දාමු කියල යෝජනා කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය පෙ.ව 10.57 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇත්තටම අපි යෝජනා දාමු. තමන්ගේම ස්වයං සංයමයකින් අපේ ප්‍රතිපාදන, සභාවේ ප්‍රතිපාදන ඒවාත් එක්ක බලලා තම තමන්ට අත්‍යවශ්‍ය ඒවා බලලා යෝජනා ඉදිරිපත් කරන ලෙසත්,ඉදිරියේදී දාන යෝජනා

සංයමයකින් ඒ විදිහට යෝජනා දාන්න කියලා මතක් කරන බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

05 (i) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

කාර්යාලීය ජංගම දුරකතන අංකය හා වට්ස්ඇප් ගිණුම මඟින් සේවා සැපයීම, නිල ෆේස්බුක් ගිණුම යාවත්කාලීන කිරිම, ඡායාරූප ලබා ගැනීම ආදී කටයුතු සඳහා සුදුසු තත්ත්වයේ ස්මාර්ට් ජංගම දුරකතනයක් මිල දී ගැනීමට යෝජනා කරමි.

මෙම යෝජනාව **ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා** විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

විෂය කරන අපේ නිලධාරීතුමිය දැනට භාවිතා කරන්නෙත් එතුමියගේ පෞද්ගලික දුරකථනයක් බවත්, ඒ නිසා සභාවේ වැඩ කටයුතු සඳහා භාවිතයට ගැනීමට දුරකතනයක් ලබා ගැනිම සඳහා මේ යෝජනාව යොමු ක්ළ බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි,කලින් දුරකථනයක් තිබිලා නැද්ද යනුවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.
තිබිලා තියෙනවා.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි , සභාවේ කලින් ගැලැක්සි ස්මාර්ට් ෆෝන් එකක් තිබී ඇති බවත්, එහි බැටරිය ඔන් නොවී කිහිප වතාවක් අලුත්වැඩියා කර ඇති බවත්, ඒ අතරේ එහි සිම් එක එතුමියගේ ෆෝන් එකට දාගෙන තමයි වැඩ කටයුතු කළ බවත්. සභාවේ වට්ස්ඇප් ගෲප් එකක් සහ තව ගෲප් ටිකක් තිබෙන බවත්, ඒ ටික හරියට ක්‍රියාත්මක කරන්න සභාවට ජංගම දුරකථනයක් අවශ්‍ය බවත්, ඒ නිසා මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්,මෙය කාලෝචිත යෝජනාවක් බවත්, **ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා පෙ.ව 11.00 ට සභා ගර්භයෙන් පිට විය

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මෙය මුදල් කාරක සභා අවස්ථාවේදී සියලු දෙනාගේ යෝජනාවක් අනුව තමයි මෙය සභාවේ න්‍යාය පත්‍රයට මෙය ඇතුළත් කළ බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

ගරු සභාපතිතුමනි, තාක්ෂණයේ දියුණුවත් මත ක්ෂණික දැනුම්දීම ප්‍රයෝජනවත් විමට පුළුවන් බවත්, මේ වට්ස්ඇප් වලින් දැනුම්දීම නිසා පණිවිඩ දෙකක් මග ඇරි තිබෙන බවත්, ප්‍රාදේශිය සභාවේ සේවය කරපු සරත් මහත්මයාගේ විශ්‍රාම යාමේ සාදය තිබිලා තියෙනවා, ඒක දුරකථනයේ ආල තියෙනවා. මම ඒක දැක්කේ දිනය පහු වුණාට පස්සේ. නමුත් කල් ඇතුව ඒක දැක්කා නම්, බැලුවා නම් ඒ ගැන මට අවබෝධයක් තිබුණා නම්, තමන් ඒ උත්සවයට සහභාගී වෙන බවත්, ඊළඟට පරිසර කමිටුවට පළවෙනි අවස්ථාවට සහභාගී වෙන්න බැරි වුණෙත්, වට්ස්ඇප් මගින් දැනුම්දීම නිසා.ඉතින් මේක සාමූහිකව ගත්තොත් අපේ

දුර්වල කමක්ද.මේ පණිවිඩ දිය යුත්තේ මීට වඩා ප්‍රයෝජවනත් වන විදිහට ලිඛිතවද කියන එක ගැන තීරණයක් ගත යුතු බවත්, ඒ අනුව මම ප්‍රකාශ කරනවා මේවා ලිඛිතවත් දැනුම් දෙනවා නම්, මම හිතන්නේ මීට වඩා සහභාගී වීමේ අවස්ථාව උදා වෙන බවත්, මොකද මේ දුරකථනයම බලන්න ඕනි මේ පණිවිඩය දැනගන්න. සමහර විට දුරකථනය ක්‍රියාකාරීව නොතිබෙන්නත් පුළුවන්. ඒ අවස්ථාවේදී . මම හිතන්නේ ඩේටා ඔන් කරලා නොතිබෙන්නත් පුළුවන්. අන්න ඒ අවස්ථාවේදී ගැටළු සහගත අවස්ථාවක් මතු වන නිසා, ලිඛිත පැත්තටත් මේ පණිවිඩ හුවමාරුව ක්‍රියාත්මක වෙනවා නම් හොඳයි කියලා මම අදහසක් හැටියට යෝජනා කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

සරත් මහත්මයාගේ එක නිල කටයුත්ත නිල කටයුත්තක් නොවන බවත්, එය එයාගේ පෞද්ගලික දැනුම්දීමක් බවත්, ඒක මෙතෙන්ට අදාළ නැති බවත්, කාරක සභා අවස්ථාව නිල වශයෙන් දැන්වීම ඊළඟ මාසයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

05 (ii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ නිලධාරින්ට රාජකාරී කටයුතු සඳහා යැමට ප්‍රමාණවත් වාහන නොමැති විම හේතුවෙන් ආදායම් එක්රැස් කිරිමේ කටයුතු, කර්මාන්ත අධීක්ෂණ කටයුතු, අනතුරුදායක ගස් පරීක්ෂාව, මහජන ගැටලු හා පැමිණිලි පරීක්ෂා කිරීමේ කටයුතු බොහොමයක් මහ හැරී ඇති බවත්, මහජන සේවාවන් ප්‍රමාද වන බවත් නිරීක්ෂණය වී ඇත.

එබැවින් එම රාජකාරී විධිමත් කර ගැනිම සහ කඩිනම් කර ගැනිමේ අරමුණින් පෙට්‍රල් ත්‍රි රෝද රථයක් මිලදී ගැනිමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 11.03 ට සභා ගර්භයෙන් පිට විය

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා

ගරු සභාපතිතුමනි, මේ සඳහා ප්‍රතිපාදන කොහෙන්ද කියලා දැනගන්න පුළුවන්ද? යනුවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මේ සඳහා ප්‍රතිපාදනත් සභාවෙ අරමුදලින් බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා කියා සිටියේ ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.04 ට සභා ගර්භයෙන් පිට විය.

එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

05 (iii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

දිට්වා සුළි කුණාටුව අවස්ථාවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත් අංක RD 7300 ට්‍රැක්ටරය හා RX 1481ජල බුසරය මේවන විට ධාවනයේ යොදවා ඇති අතර මෙතෙක් මෙම ආයතනය වෙත පවරා ගෙන නැති වුවද, මේවන විටත් ධාවනයේ යෙදෙන බැවින් පූර්ණ රක්ෂණයක් ලබා ගැනිමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

දිට්වා සුළි කුණාටුව අවස්ථාවේ ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ට්‍රැක්ටර් බවුසරය තිබුණු බවත් ඊට කලිනුත් මෙය ක්‍රියාත්මක කිරීමේදී ,රියදුරා වශයෙන් සහභාගී වුනේ සභාවේ රියදුරු මහතෙකු බවත්, පුද්ගලිකව ප්‍රාදේශීය ලේකම්තුමිට කරපු යෝජනාවක් හැටියට, ඒ අවස්ථාවේදී මේක සභාවට ගත් බවත්, ඊට පස්සේ මේක සභාවේ දිගටම තිබුණු බවත්, දිස්ත්‍රික් ලේකම්තුමා කිව්වා මේක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දුන්නත් මෙය භාවිතා කරන්නේ සභාවෙන් නිසා සභාවයට මෙය දෙන්න කියලා කිවු බවත්, මෙහි නීත්‍යානුකූල වැඩ කටයුතු සිදු කරගෙන යන බවත්, මේ කාර්යය කරගෙන යන්න කියලා නිල නොවන විදිහට එතුමා වට්ස්ඇප් මගින් මට දැනුම්දීල තියෙන බවත්, එම නිසා නිල වශයෙන් රාජකාරි කටයුතු ටිකක් තිබෙන බැවින්, එතෙක් සභාව මෙය භාවිතා කරන බවත්, ඒ සඳහා තමයි මේ රක්ෂණ වාරිකය ලබා ගැනිමට යෝජනා කරන බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.06 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, කිසිඳු ගැටළුවක් නැහැ. මේ සභාවේ සම්පත් සභාවේ ජනතාව වෙනුවෙන් ප්‍රයෝජනයට ගත්තට. නමුත් අපිට රක්ෂණය කරනවා නම් රක්ෂණ හිමිකමක් තිබිය යුතුයි. එම හිමිකම තියෙන්නේ,දැනට ඔබ කියපු විදිහට ප්‍රාදේශීය ලේකම් සතුව. එවිට අපිට ප්‍රාදේශීය ලේකම් සතුව තියෙන වාහනයකට අපේ සභාවේ අරමුදලින් රක්ෂණය කරන්න අවස්ථාවක් තියෙනවාද ? යන්න ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මේ සම්බන්ධව නීති කටයුතු කථා කළ බවත්. වාහන දෙකක් නෙමෙයි ජල බවුසරය. අංක දෙකක් හැටියට දාල තියෙන්නේ බවුසරය. මේක භාවිතා කරන්නෙත් සභාව. මෙය ධාවනය වන අතරතුර මොකක්හරි වුණොත් සභාවට තමයි එම වියදම දරාගන්න සිදුවෙන්නේ. මේ පිළිබඳව දිස්ත්‍රික් ලේකම්තුමාට පුද්ගලිකව කතා කළ බවත්, මෙය අනිවාර්යයෙන්ම කළ යුතු දෙයක් බවත්, එසේ නොවුණ හොත් රක්ෂණ සහතිකයක්

නැතිව නීත්‍යානුකූලව ධාවනයේ යොදන්න බැරි බවත්,. අනිවාර්යයෙන්ම මේ සඳහා රක්ෂණ සහතිකයක් ලබාගත යුතු බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, රක්ෂණ සහතිකය ලබාගත යුතුයි. තමන් ප්‍රකාශ කරන්නේ, මේක ප්‍රාදේශීය සභාව සතුව වත්කම් ලේඛනයේ ඇති මෝටර් රථයක්නේ. එවිට මේක ප්‍රාදේශීය ලේකම් සතුව තියෙන එකක් බව යන්න ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා පෙ.ව 11.10 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

නැහැ. දැනට ප්‍රාදේශීය ලේකම් එකෙන් ඉවත් කර තිබෙන බවත්, ප්‍රාදේශීය ලේකම්ට අයිති නැති බවත්, මේක ආපදා එකෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයු බවත්, ප්‍රාදේශීය ලේකම්තුමිය එය නැවත දිස්ත්‍රික් ලේකම්තුමාට ලබා දී ඇරති බවත්, දිස්ත්‍රික් ලේකම්තුමා ඒක සභාවට දෙන්න නැවත යවන්න ඕනේ ප්‍රධාන ආපදා අමාත්‍යාංශයට.ඒ සඳහා තියෙන අමාත්‍යාංශයට.එහෙන් එවන තුරු තමා මේ තියෙන්නේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මෙය අයිති නොවන බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මම විශ්වාස කරනවා ගරු සභාපතිතුමා,මේක සභික මණ්ඩලයේ අදහස් යෝජනා සම්මත වෙලා තමයි මේක ඉල්ලන්නේ. තමා සිටිය සභාවක නම් එහෙම යෝජනාවක් සම්මත නොවුණ බවත්,තමන් විශ්වාස කරන අන්දමට ඒ යෝජනාව සම්මත වෙලා තිබිය යුතුයි. නැත්නම් අධිහාර ඇවිල්ලා ගෙවන්න වුණොත් සභාව අසරණ වෙන බවත්, තමන් මෙයට විරුද්ධතාවයක්වත් ,මෙය රක්ෂණය කරනවාට විරුද්ධ වෙනවා නෙමෙයි මේ කියන්නේ. අපි මන්ත්‍රීවරු විදිහට නීත්‍යානුකූල ආකාරයට ගොස් මේ කාර්යය සිදු කරමුයි කියලා තමයි මම යෝජනා කරන්නේ. නීතිමය තත්වය පැහැදිලි කරගන්නයි අවශ්‍ය. එවිට සභා යෝජනාවක් සම්මත විය යුතුයි,මේ බවුසරය ආපදා මධ්‍යස්ථානයෙන් අපි සභාවට අත්පත්කර ගන්නවා කියලා. ඒ යෝජනාව සම්ත වෙලා තමයි ඊළඟ ක්‍රියාවලියට යා යුත්තේ. එවිට අපි දන්නේ නැහැ ජල බවුසරයක් අපේ පාලනය යටතේ තියෙනවද කියලා. මම නම් දන්නේ නහැ කියා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මෙය මීට පෙර මම සඳහන් කළා වගේ මතකයි බවත්, මේක ගෙනල්ලා මාස 04 කටත් වැඩි බවත්, කරන්න ඕනි නෛතික වැඩ ටික ඔක්කොම කර තිබෙන බවත්,ආණ්ඩුකාරතුමියට යොමු කර සම්පූර්ණයෙන් ඒ වැඩ ටික කර තිබෙන බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගැටළුවක් නැත්නම් ප්‍රශ්නයක් නැති බවත්, .මන්ත්‍රීවරු විදිහට වගකීමකුත් නැති බවත්, මේක අපි නිරාකරණය කරගෙන ඉදිරියට යමු. කිසි ගැටළුවක් නැහැ. මම කියන්නේ නීතිමට කටයුතු ඔබතුමා සලකා බලලා,ඒ පිළිබඳව කටයුතු කරන්න කියන ඉල්ලීම මම මේ වෙලාවේ සිදුකරනවා. නැත්නම් යම්කිසි ගැටළුවදි අපිව මේ සඳහා මන්ත්‍රීවරු විදිහට බැඳීමක් ඇති කරගන්න එපා කියලා කියන බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

එහෙම අකමැති අය ඉන්නවා නම්, ඡන්දයක් තියමු. මොකද අනිවාර්යයෙන් මේක ස්ථිර කරන්න ඕනි. නැත්නම් රක්ෂණය නැතුව මේක දුවන්න හම්බවෙන්නේ නැති බවත්, මේ අවස්ථාවේ ආපදා තත්වයත් එක්ක මේක සභාවට අත්‍යවශ්‍ය බවත්, එහෙම නැති වුණොත් සභාවේ පසුගිය දිනවල මෙම ජල ටැංකිය සහ ට්‍රැක්ටරය ලොකු පිටුවහලක් වුණු බවත්, එම නිසා මෙය ප්‍රමුඛ කාර්යක් වන්නේ මහජන උපයෝගිතා වැඩසටහන. මේ වගේ ඒවට අපිට මැදිහත් වෙන්න වෙනවා. එහෙම අකමැති කෙනෙක් ඉන්නවා නම් තමාගේ අකමැත්ත ප්‍රකාශ කල හැකියි. නමුත් අපි වැඩි ඡන්දයෙන් මේක සම්මත කරගන්න අත්‍යවශ්‍ය බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මේ සඳහා වැරදි අදහසක් වාර්තා වෙයි. ජල බවුසරය අත්පත් කරගෙන ජනතාවට සේවයක් සිදු වෙනවාට මම විරුද්ධ නැහැ. එවිට මම කියන්නේ මේ ජල බවුසරය අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේදී ,මම දන්න විදිහට සභාවේ යෝජනාවක් සම්මත වෙලා නැහැ. මගේ දැනීමේ හැටියට සභාවේ යෝජනාවක් සම්මත විය යුතුයි. හැම සභාවකටම මම මෙතුවක් කාලයක් පැමිණියා. එහි අඩුපාඩුවක් තියෙනවා නම් එය සභාවට යොමු කරලා නිවැරදි කරගන්න. එවිට රක්ෂණය කරනවිට එහි රක්ෂණ අයිතිය මම දන්නේ නැහැ ප්‍රාදේශීය ලේකම් සතුවද දිස්ත්‍රික් ලේකම් සතුවද කියලා. ඔබතුමා කියන විදිහට මේ සංක්‍රාන්ති කාලයක්. අයිතිය එහා මෙහා වෙන කාලයක්. එහිදී අපිට නීත්‍යානුකූල බලය තියෙනවා නම් රක්ෂණ අයිතියි ලබා ගැනීමට ඒක කිසිදු ගැටළුවක් නැහැ. නමුත් යම් කිසි නීත්‍යානුකූල තත්වයකදී මන්ත්‍රීවරු විදිහට අහිංසක අපිව මේ සඳහා සම්බන්ධ කර ගන්න එපා කියන එක මේ සභාවේ ප්‍රකාශ කරන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ඇත්තටම අපි අත් දෙකම උස්සනවා. ඒ මන්ත්‍රීතුමා කිවුවේ වැරැද්දක් නෙමෙයි. මම නැවත නැවතත් සභාවට ඉදිරිපත් කරනවා ලියන අය ලියන්න 2024 අහවල් දිනැති සභා රැස්වීමේදී ගත් තීරණය පරිදි බවුසරය අත්පත් කර ගැනීමේ කටයුතු කළා. එහි දෙවෙනි අදියර වශයෙන් මේ සඳහා අපි රක්ෂණය කල යුතුයි කියන යෝජනාව ගෙනාව නම් ඒක එතකොට යෝජනාව.මොකද මෙහි නීති රාමුවක් තියෙනවා ගරු සභාපතිතුමා,සභාවට යෝජනාවක් ඉදිරිපත් කරලා ඒ යෝජනාව ස්ථිර වුණාට පස්සේ, ඔබතුමා විසින් ගත්තු තීරණ අනුව ලැබුනට පස්සේ,අපි ඒවා නීත්‍යානුකූල කළ යුතුයි. අපි ඒකට අත් දෙකම උස්සනවා. අපේ මන්ත්‍රීවරුන්ට ඒ වගේ අවස්ථාවක් අවොත් සභාපතිතුමා ,උපසභාපතිතුමා අපිට ජල බවුසරය දෙන්න කිවුවොත් දෙන්න බැහැ. ඒක අපි ළඟ තියෙන සම්පතක්. ඒ නිසා අපි අත්දෙක උස්සලා .මම කියන්නේ නීතිවලට එකඟව කටයුතු කරන්න ගරු සභාපතිතුමා. ඒක ප්‍රශ්නයක් නැහැ. අපි අත්දෙකම උස්සනවා. මෙතන බෙදීමක් අවශ්‍ය නෑ. අන්න ඒ රාමුවට එන්න .මෙන්න මේ වාක්‍ය ලිවීමේදී නිවැරදිව ලියන්න කියන එක තමයි මේ කියන්නේ. මෙය නිවැරදි කරන්නේ නැති නිසා තමයි මේ සභාව මේ විදිහට යන්නේ යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව මේක තිබුණා මේක තෙම් තෙම් සමෘර්ධි කාර්යාලය ළග තිබුණා. බැටරි යොදලා තමා මෙය පන ගන්වා ගත්තෙත්. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ යෝජනාවක් අනුව තමයි අපිට මේක ලැබෙන්නේ. අපිට ඒ ලැබුණ ප්‍රධානයක්.එක සභාවේ අනුමැතියක් අරන් පවර ගත්ත එකක් නෙමෙයිනේ. එවිට අපිට ඒකට සභා යෝජනාවක් දාල අපිට ඒක හදලා, අපිට අත්ට්‍රැක්ටර් දෙකක් ලැබුණා. ඒකත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු තීරණයක් අනුව තමයි ප්‍රාදේශීය සභාවට ලැබුණේ. ඒ දෙක ගත්තත් දැන් අපි ආදායමක් ලබන්න උත්සාහ කරනවා. සභාවේ වත්කම් ලේඛනය ගත්තත් අපි ඒකේ පැවරීම් ක්‍රියාවලිය විධිමත්ව ඉදිරියට යනවා. මේකට ලොකු බෙදීමක් අවශ්‍ය නැහැ. අපි හැමෝටම ඒකමතිකව සම්මත කරගෙන ඉදිරියට යන්න පුළුවන් බවත් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා පෙ.ව 11.15 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 11.15 ට නැවත සභාවට පැමිණෙන ලදී

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මෙතනදි අපිට පැහැදිලි කරගන්න ඕනේ, සභා ප්‍රතිපාදන වලින් රක්ෂණය කර ගන්න එක ගැන. ඒ පිළිබඳව සභාවට ගැටළුවක් නැත්නම් අපිට ගැටළුවකුත් නැහැ. ඒ වගකීම දරන්න හැකියාවක් තියෙනව නම් අපිට ගැටළුවක් නැහැ. ඒ කියන්නේ අපේ ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා රක්ෂණය කිරීමට කිසිදු විරෝධතාවයක් නොමැත.නීතිමය ප්‍රතිපාදනයක් තියෙනවා නම් ඒ සම්බන්ධව ගැටළුවක් නැහැ.එහෙම ගැටලුවක් තියෙනව නම් ඒකට ක්‍රමවේදයක් යොදන්න කියලා තමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා යෝජනා කන්නේ යනුවෙන් පැහැදිලි කිරීමක් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇත්තටම මේක රක්ෂණය කරන්නේ නැතුව දිව්වොත් තමයි ගැටළුවක් ඇති වෙන්නේ. ඒක ප්‍රධාන ලේකම්තුමා යටතේ තියෙන එකක්නේ. ඒක හින්දා දැන් කිසිම ගැටළුවක් ඇති වෙන්නේ නැහැ. එහෙන් තමා අපිට මේක කියලා තියෙන්නෙත්,එහෙම රක්ෂණය කරන්න කියලා යනුවෙන් **ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිනිය.

ගරු සභාපතිතුමනි, මේක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් බව තියෙනවා. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කියන කතාවක් මේකෙ නෑ.ඊට අමතරව තියෙනවා ආයතනය වෙත පවරා ගෙන නැති වුණ ද මේක රක්ෂණය කරන්න ඕන කියලා.ඒක යෝජනාව දාපු එකේ වෙනසක් තියෙනවා.ඒ අනුව මම හිතන්නේ මෙහි නීත්‍යානුකූල පැත්ත සුදුසු නම් මේක අපි යෝජනා කරමු. අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. මොකද ජලය නොමැති කාලයේ දී මමත් රාජ්‍ය නිලධාරියෙක් විදිහට මමත් දන්නවා මේ ජල බවුසරයෙන් විශාල සේවයක් වෙනවා. මේක නීත්‍යානුකූල විදිහට කරන්න කියන තමයි අපේ යෝජනාව.ඒ යෝජනාව බලනකොටම තේරෙනවා අපි වෙත පවරාගෙන නැති වුවද අපි රක්ෂණය කරමුය කියලා. ඒ නිසා මේක නිත්‍යානුකූලව කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි **ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිනිය විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා පෙ.ව 11.18 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මේක සභා සම්මත කරනවාද නැත්නම් බෙදීමකට යනවාද.කවුරු හරි ස්ථිර කරන්න යනුවෙන් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා.

ගරු සභාපතිතුමනි, අංක RD 7300 ට්‍රැක්ටරය හා RX 1481ජල බුසරය මේවන විට ධාවනයේ යොදවා ඇති අතර මෙතෙක් මෙම ආයතනය වෙත පවරා ගෙන නැති වුවද, මේවන විටත් ධාවනයේ යෙදෙන බැවින් පූර්ණ රක්ෂණයක් ලබා ගැනිමට යෝජනා කර මෙම යෝජනාව ස්ථිර කරගමු කියලා යෝජනා කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

පහුගිය කාලේ වෙන කොට ට්‍රැක්ටර් කිපයක් ම තිබුණේ ප්‍රධාන අමාත්‍යාංශයේ. අපි ට්‍රැක්ටර් දිව්වේ අපේ සභාවට මේවා අයිතිව තිබුනේ නැහැ. ලේකම් යටතේ තිබුනේ.හැබැයි අපි හැම එකක්ම ඉන්ෂුවරන්ස් කළා. ඒක මම සභාවේ කියනවා. ඒක කරන්න ඕනි.ඒක ගැටළුවක් ඇති වෙන්නේ නැහැ. යනුවෙන් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

ඒ යෝජනාවට අපි අධිභාරයට ලක් වෙලා ගැටළුවක් ඇති වෙන්නේ නැත්නම් ගැටළුවක් නැති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

05 (iv) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට අයත් පහත සඳහන් වාහන කිහිපයක් වසරකට වඩා වැඩි කාල සීමාවක සිට අලුත්වැඩියා කර නොමැති බැවින් එම වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට යෝජනා කරමි.

*LL- 7088 ලොරි රථය
*RD- 6461 ට්‍රැක්ටර් රථය
*RE- 2268 ට්‍රැක්ටර් රථය
*RA- 3887 ට්‍රැක්ටර් රථය

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.20 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මේකත් අර කලින් කිව්ව වගේ එකක් තමයි .ලොරි රථය වැඩි ගානක් යන්නේ නැතුව හදාගන්න පුළුවන් වෙයි. අනිත් ට්‍රැක්ටර් රථත් නිකන් තියෙන ඒවා. වැඩි මුදලක් යන්නේ නැත්නම් මේවා අපි .නැත්නම් නිකම්ම තියෙනවා.ඒ නිසා මේවා නවීකණය කරන් යෝජනා කළ බවත්. **ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.**

එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

05 (v) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් සැපයුම්කරුවන් පිරිසක් ලියාපදිංචි වී නොමැති බැවින් සැපයුම්කරුවන් නැවත ලියාපදිංචි කර ගැනීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම** විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සමඟ සේවා සපයන්නන් හා සැපයුම්කරුවන් ලියාපදිංචි වෙලා නැහැ.එහෙම ඉන්නව නම් හිතවත් අය දන්න අය, පිළිගත් අය ඉන්නව නම් ලියාපදිංචි කරන්න යෝජනා කළ බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, විෂය නිලධාරින්ගෙන් මේ සඳහා ගැටලුව මොකක්ද යන්න විමසුවාද යන්න ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රශ්න නගන ලදී.මේ සඳහා ගන්න ලියාපදිංචි ගාස්තුව වැඩියි කියලා.සමහර විට ලියාපදිංචි ගාස්තුව අඩු කරන්න අවශ්‍යද දන්නෙත් නෑ.ගාස්තුව අඩු කරන්න ඒ ගැන හොයල බලල ප්‍රතිකර්මයක් කරන්නත් අවශ්‍යයි. අපි හොයල බලන්න ඕනි මෙම සැපයුම්කරුවන් ලියාපදිංචි වෙන්නේ නැත්තේ ඇයි කියලා. සමහර විට තැන්පත් කරන්න ඕන මුදල වැඩි ඇති. එහෙම උනොත් අපි සභාවේ යෝජනාවක් කරන්න ඕනි මේක අඩුකරගන්න. එහෙම උනොත් අපිට සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම පහසුයි යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා අදහසක් ඉදිරිපත් කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා පෙ.ව 11.22 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඒ මන්ත්‍රීතුමාගේ කතාවට මමත් එකඟ වෙනවා. අපි මේකට දැන්වීම් වගයකුත් ගැහුවා.ප්‍රසිද්ධත් කළා. නමුත් අපි ගන්න තැන්පත් මුදල වැඩිද දන්නෙත් නැහැ,සැපයුම්කරුවන් ලියාපදිංචි වෙන්න ආයතනයත් එක්ක සම්බන්ධ වෙනවා හරි අඩුයි. එක්කෙනෙක් දෙන්නෙක් ඇරෙන්න කවුරුවත් තව සම්බන්ධ වෙලා නැහැ.ඒ නිසා අපි මුදල් ගාස්තුව ගැනත් බලලා.අපි ඒක සංශෝධනයක් කර ගැනිම සුදුසු බවත්, එය නිරාකරණය කරගැනීම සඳහා අපි මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙස ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා පෙ.ව 11.23 ට සභා ගර්භයෙන් පිට විය.

ඒ අනුව උපසභාපති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් සභාව කාරක සභාවක් කිරිමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා විසින් ඒම යෝජනාව ස්ථිර කරන ලදී.

සභා ලේකම්තුමා විසින් 05 (v) යෝජනාවට අදාළව කරුණු පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා පෙ.ව 11.25 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් කාරක සභාව මහා සභාවක් කිරිමට යෝජනා කළ අතර,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ඒම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා පෙ.ව 11.26 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිමේ දුෂ්කරතාවයක් මතු වි තිබෙන්නේ, අපි වර්ෂය මුලදී සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 3000.00ත් රු.5000.00ක් වගේ මුදලක් අයකරලා තියෙනවා. එවිට අපි මෙහිදී නැවත නැවතත් හොඳ සැපයුම්කරුවන් මෙම සභාවට එකතුකර ගන්න නම්,ලියාපදිංචි කර ගන්න නම් මේ මූලිකව අයකරන ලියාපදිංචි ගාස්තුව අඩුකරගන්න ඕනි. ඒ අනුව මම යෝජනා කරනවා ,සාමාන්‍ය සැපයුම්කරුවෙකුගෙන් රු.250.00කුත් ,කොන්ත්‍රාත් සැපයුම්කරුවෙක්ගෙන් රු. 500.00කුත් ලෙස ,මේ ගාණන සංශෝධනය කරලා අපිට සභාවට පාඩුවක් වෙන්නේ නැහැ. උදාහරණයක් ලෙස ගස් කපන්නන් ලියාපදිංචි වෙන්නේ නැහැ රු.3000.00ක් දීලා. ඒ කියන්නේ රු. 250.00ක් වගේ අය කරලා ඔවුන් ලියාපදිංචි කරගත්තම හදිසි අවස්ථාවකදී ප්‍රයෝජනයට ගන්න පුළුවන්. ඒ අනුව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී **දිලීන් කරුණාපාල මැතිතුමා විසින් සංශෝධිත** යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

**සංශෝධිත යෝජනාව.**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

**ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් සැපයුම්කරුවන් පිරිසක් ලියාපදිංචි වී නොමැති බැවින් සැපයුම්කරුවන් නැවත ලියාපදිංචි කර ගැනීමට යෝජනාව සඳහා මෙතෙක් වාර්ෂිකව අය කළ රුලියල් 3000.00 ක මුදල, සංශෝධනය කර සාමාන්‍ය සැපයුම්කරුවන් සඳහා රුපියල් 250.00 ක මුදලක් ද කොන්ත්‍රාත් සැපයුම්කරුවෙක් සඳහා රුපියල් 500.00 මුදලක් ද වශයෙන් මුදල් අය කර සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම සුදුසු බවට යෝජනා කරමි.**

මෙම සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී ඒ.ටි.සී.අතුරලිය මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, සංශෝධිත යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය

05 (vi) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

2026.04.07 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා තීරණ හා බැදේ. අංක 138/ 2, රෝහල පාර ඇහැලියගොඩ ලිපිනයෙහි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 200020703949 දරණ හේවගේ සුදර්ශන සම්පත් යන අය මාස තුනෙන් තුනට බණ්ඩනය වන පරිදි තත්කාර්ය පදනමින් සේවා ගිවිසුම් මත සේවයට යොදවා ගැනීමටත් ඔහුට 10/2025 චක්‍රලේඛ අනුව වැටුප් ගෙවීමටත් යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා පෙ.ව 11.30 ට සභා ගර්භයෙන් පිට විය. නැවත සභාවට පැමිණෙන ලදී.

05 (vii) ගරු සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා.

සබරගමු පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/-5/3/1-(IV වෙළුම) හා 2026.01.01 දිනැති ලිපිය මඟින් අතුරු බදු දී ඇති කඩකාමර නියමානුකූලව කර ගැනීමට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව සතු පහත උපලේඛනයේ සඳහන් වෙළෙඳ ස්ථාන අදාල බදුකරුවන් විසින් අතුරු බදු දීම සිදු කර ඇති බැවින් අදාළ බදුකරුවන් සමඟ පැවති ගිවිසුම් අවලංගු කිරීමටත්, අතුරුබදුකරුවන් සමඟ ගිවිසුම් ගත වීමටත්,වර්ථමාන රජයේ තක්සේරුව අනුව පෙර ගෙවුම් මුදලින් 25% ක වටිනාකම් හෝ බදු දී ඇති මුල් කීමනී වටිනාකමින් 25% ක අගය යන වටිනාකම් වලින් වැඩි අගය අතරු බදුකරුවන්ගෙන් අයකිරීමටත් හා මාස 06 ක ඇප මුදල් ලබා ගෙන අදාල පැවරීම නියමානුකූල කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | කඩ කාමරය පිහිටි ස්ථානය | පළමු බදුකරු | අතුරු බදුකරු |
|---|---|---|---|
| 01 | වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 05 | එච්.එම්.ප්‍රභාත් ප්‍රසන්න ගම්ලත් මයා | ඩබ්.ඩී.නිමල් කරුණාතිලක මයා |
| 02 | වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 07 | යූ.එල්.ඩී.අජිත් අරවින්ද මයා | ජී.ඒ.වුලසේන මයා |
| 03 | වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 09 | චිත්‍රා උපුල් රණසිංහ මයා | ජේ.ඒ.ඩී.සුනේත්‍රා ජයසිංහ මිය |
| 04 | වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 10 | එච්.එම්.අයි.ටී.වීරවංශ මයා | එච් සිරිසේන මයා |
| 05 | වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 14 | එම් සී එම් නිෂාම් මයා | ඩබ්.ඒ.එස්.වීරසිංහ මයා |
| 06 | වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 15 | ජී.එච්.එස්.එන්.කුමාර මයා | ජගත් ප්‍රේමලාල් පින්නගොඩ විතාන මයා |
| 07 | වෙළෙඳ සංකීර්ණය බිම් මහල අංක 07 | ඒ.ඒකොඩිප්පිලි මයා | විශ්මි නවෝදාා අබේසිං කොඩිප්පිලි මිය |
| 08 | බස් නැවැතුම්පල අසල අංක 01 | එම්.පී.සුමිත් ජයසිංහ මයා,පී.සුනිල් චන්ද්‍ර මයා | එල්.ගුණසේගරන් මයා |
| 09 | බස් නැවැතුම්පල අසල අංක 03 | වෙ.ලෙ.මොහොමදු රියාදු මයා | ඩී.එම්.එස්.කුමාරසිංහ මිය |
| 10. | බස් නැවැතුම්පල අසල අංක 07 | ඒ.එල්.ඒ.ඉක්බාල් මයා | ඊ.ඩබ්.නිහාල් පද්මසිරි මයා |

1.ගරු ප්‍රාදේශිය සභා සභාපති බන්දුලසේනදූණුවිල මැතිතුමා.
2.ගරු ප්‍රාදේශිය සභා උපසභාපති යූ.එල්.එන්. මහේෂ් රත්නායක මැතිතුමා.
3.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා.
4.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා.
5.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි එස්.එම්.එස්.සුමිත්‍රා සේනානායක මැතිනිය.

සංශෝධිත යෝජනාවට අත්සන් කළ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන්

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, 25% ක ගාස්තුවක් අය කරනවා කියලා යෝජනා කරලා තියෙන්නේ.මෙය සමීක්ෂණයක් කරලා, අධීක්ෂණයක් කරලා ගත්ත තීන්දුවක්ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් විමසන ලදි.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

දැනට කඩ කරගෙන යන අයට ම මෙය පවරන බවත්, ඔවුන් ඒ සඳහා කැමති බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

05 (viii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ මහජන පුස්තකාලය පළාත් සභා ප්‍රතිපාදන යටතේ අලුත්වැඩියා සිදු කර ඇත.එසේ වුවත් පුස්තකාලයේ ගෙබිම පුපුරා ඇති අතර වේයන් මතුවන බැවින් පුස්තකාලයේ පොත් හානියට පත්වේ. ඇහැලියගොඩ රෝහලේ තැන්පත් කර ඇති අතර පොත් නැවත පුස්තකාල ගොඩනැගිල්ට ගෙන ඒමට පෙර පොත්පත් ආරක්ෂා කර ගැනීමටත් ගෙබිම සවිමත් කර ගැනීම සඳහාත් පුස්තකාල ගොඩනැගිල්ලේ ගෙබිම කොන්ක්‍රිට් කර ගැනීමට අදාළ රු.442,000.00 වටිනා ඇස්තමේන්තුවට අනුමැතිය ලබා දීමටත් අදාළ කාර්ය අනුමත සමිතිය මඟින් ඉටු කරවා ගැනීමට සුදුසු බව යොජනා කරමි.නව මිල ගණන් යටතේ ඇස්තමේන්තු මුදල සංශෝධනය විය හැකි බව දන්වමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිනිය විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

අපේ මහජන පුස්තකාලයේ වහලය සහ බිත්ති කපරාදු කරලා අලුතින් ප්‍රතිසංස්කරණය කළ බවත්, දැන් ඒ වෙනුවට තාවකාලිකව ඇහැලියගොඩ රෝහල් භූමියේ පුස්තකාලය පවත්වාගෙන යන බවත්, ඔවුන්ට ගොඩනැගිල්ල නිදහස් කරදෙන්න කියලා ඔවුන් දිගින් දිගටම කියා සිටින බවත්, නමුත් ප්‍රතිපාදන ලැබුණේ ගොඩනැගිල්ලේ වහලය සෑදීමට සහ කපරාදු කරලා තීන්ත ගෑමට පමණක් බවත්, එම නිසා මෙය ගෙන ඒමට පෙර ටයිල් අතුරා ගැනීමට නොහැකි වුණත්, කොන්ක්‍රීට් කර මෙය සිදුකරගතහොත් ,එතෙක් කුමක් හෝ ප්‍රතිපාදනයකින් ටයිල් අතුරාගන්නා තෙක් සිවිලිම ගහන්න අවශ්‍ය බවත්, සභා අරමුදලින් රු.442,000.00 වටිනා ඇස්තමේන්තුවක් සකසා තිබෙන බවත්, එය නව මිල ගණන් යටතේ නෙවෙයි හදලා තියෙන්නේ. එහි පොඩි මුදලක් වෙනස් විය හැකි බවත්, මේකට යටත්ව තමයි මේ යෝජනා කරන්නේ, මෙම කොන්ක්‍රීට් කිරීමට ඇස්තමේන්තුව අනුමත කර දෙන්න ලෙස ඉල්ලා සිටින බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා

ගරු සභාපතිතුමනි, මෙම රු.442,000.00 වටිනා ඇස්තමේන්තුව සමහර විට ලක්ෂ පහක් වෙයි. අපි රෝහලේ ඉදන් පොත් ටික ගෙනත් කොන්ක්‍රීට් කරලා තැන්පත් කරනවානේ. පාඨක සමාජයේ ඉල්ලීමක් තියෙනවා ලස්සනට ටයිල් ටික අල්ලන්න. සිවිලිම නම් පොත් ටික තිබුණත් සිදු කර ගන්න පුළුවන් බවත්, නමුත් කොන්ක්‍රීට් කරලා පොත් රාක්ක ටික දැම්මට පස්සේ නැවත ටයිල් කරන අවස්ථාවේදී පොත්ටික එහා මෙහා කරන්න සිදුවෙනවා. එම නිසා අපි මෙම සභාවේ යෝජනාවක් අරගෙන ,මේක ටයිල් කරන්න පුළුවන් නම් මේ අවස්ථාවේදී ඒකත් කිරීම ඉතාමත් කාර්යක්ෂමයි කියලා විශ්වාස කරනවා. වර්ග අඩි 400ක්

500ක් පමණ ඇති බවත් මේ අවස්තාවේදීම ටයිල් කිරීම සුදුසු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී **දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.**

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඒ යෝජනාවට කවුරුවත් විරුද්ධ වෙන එකක් නැහැ නේද.සංශෝධනයක් විදිහට ගරු මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා ඉල්ලීමක් කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ගරු සභාපතිතුමාගේ අංක 05(viii) යෝජනාවේ රු.442,000.00 ක් වෙනවා. ඒක සංශෝධනය වෙන්න ඉඩ තිබෙනවා කියලා ඔබතුමත් කිවුවා.අපේ මහජන පුස්තකාලයේ බිම දැඩි ලෙස හානි සිදු වෙලා තියෙනවා. බිම පුපුරා වේයන් නිසා පුස්තකාලයට හානි සිදුවෙලා තියෙනවා.එය කොන්ක්‍රීට් කර ,ඒ ගමන්ම ටයිල් අතුරා සංවර්ධනය කිරීමේ යෝජනාව ඒ ආකාරයෙන් සංශෝධනය කරලා, සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරනවා.

සංශෝධිත යෝජනාව.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

**ඇහැලියගොඩ මහජන පුස්තකාලය පළාත් සභා ප්‍රතිපාදන යටතේ අලුත්වැඩියා සිදු කර ඇත.එසේ වුවත් පුස්තකාලයේ ගෙබිම පුපුරා ඇති අතර, වේයන් මතුවන බැවින් පුස්තකාලයේ පොත් හානියට පත්වේ.එමෙන්ම ඇහැලියගොඩ රෝහලේ තැන්පත් කර ඇති අතර පොත් නැවත පුස්තකාල ගොඩනැගිල්ට ගෙන ඒමට පෙර පොත්පත් ආරක්ෂා කර ගැනීමටත් ගෙබිම සවිමත් කර ගැනීම සඳහාත් පුස්තකාල ගොඩනැගිල්ලේ ගෙබිම කොන්ක්‍රීට් කර ටයිල් අල්ලා ගැනීමට අදාළ රු.442,000.00 වටිනා ඇස්තමේන්තුවට අනුමැතිය ලබා දීමටත්, අදාළ කාර්ය අනුමත සමිතිය මඟින් ඉටු කරවා ගැනීමට සුදුසු බව යෝජනාව, සඳහා ඇහැලියගොඩ මහජන පුස්තකාලයේ ගෙබිම කොන්ක්‍රීට් කර ටයිල් අල්ලා සංවර්ධනය කිරිම සුදුසු බවට යෝජනා** කරමි.

මෙම සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී හිරිපිටිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, පුස්තකාලයේ කටයුත්ත කඩිනමින් නිම කරලා දෙන ක්‍රමවේදයකට යන්න පුළුවන් නම් ගොඩක් හොඳයි. දැනට රෝහල් භූමියත් ඉල්ලීම් කරලා තියෙනවා. අපේ රෝහල සම්බන්ධ මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම ඉන්නවා .මම හිතන්නේ දැනුවත් වෙලා ඇති. එම නිසා ඉක්මනින් එය නිරාකරණය කර ගැනීමට අවශ්‍යයි. පාඨකයින් ලොකු අපහසුතාවයකට ලක් වෙනවා. බිම හොඳට තිබ්බට වැඩක් නැ. දෙකම හැකි ඉක්මනින් නිම කරලා එම පාඨකයින්ට එම පහසුකම සලසා දෙන්න ලෙස ඉල්ලීමක් කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 11.35 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවත් හොඳයි. නමුත් අපේ අයවැයත් එක්ක අපේ තියෙන ප්‍රතිපාදනත් එක්ක එය කිරීමට හැකියාවක් තියෙනවාද යන්න බැලිය යුතු බවත්, ඉක්මනින් ටයිල් අතුරා ඒ කටයුතු ටික කරමු. අපිටත් ඒ පිළිබඳව කියා සිටිනවා රෝහලෙන්. එම නිසා ලබන සතියෙම ඇස්තමේන්තු හදලා හැකි ඉක්මනින්ම මේ මාසය ඇතුලත අපි ඒක ආරම්භ කරන්න බලාපොරොත්තු වන බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**සංශෝධිත** යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය

05 (ix) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

2026.03.10 දින පැවති මහා සභාවේ තීරණ අංක 6.07 යටතේ ඇහැලියගොඩ සභා බිම් මහලේ වැසිකිළි පද්ධතිය හා ගේට්ටුව අළුත්වැඩියා කිරිම සඳහා රු. 1,943,000.00 වටිනා ඇස්තමේන්තුව සහිත යෝජනාව අනුමත කර ඇත.එසේ වුවත් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ පොදු වැසිකිළි පද්ධති වැඩි දියුණු කිරිමේ වැඩසටහන මඟින් මෙම වැසිකිළිය අලුත් වැඩියා කිරිම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණයක් 2026.04.24 දින සිදු කර ප්‍රතිපාදන ලබා දෙන බව දැනුම් දී ඇත.

එබැවින් ඉහත යෝජනාව සංශෝධනය කර ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ කාර්යාලයේ වැසිකිළි පද්ධතිය අලුත් වැඩියා කිරිමේ යෝජනාව හා ඊට අදාළ රු.1,285,000.00 වටිනා ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ගැනීමටත් එම කාර්ය ඉටු කරවා ගැනීම සඳහා අනුමත සමිතිය සමඟ ගිවිසුම්ගත විම සඳහා ද වැඩ අවසන් ගෙවීම් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමටයෝජනා කරමි.

| | |
|---|---|
| 1.ගරු ප්‍රාදේශීය සභා සභාපති බන්දුලසේනදුණුවිල මැතිතුමා.<br>2.ගරු ප්‍රාදේශීය ජී.එච්.එන්. අජන්ත විජයසිංහ මැතිතුමා.<br>3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි එච්.රණවිර මැතිතුමා.<br>4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා.<br>5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා | සංශෝධිත යෝජනාවට අත්සන් කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ගියවර මහ සභාවේ දී පහළ තිබෙන වැසිකිළි අලුත්වැඩියාව සඳහා ලක්ෂ 19ක් අනුමත කරගත් බවත්. පසුව එය අමාත්‍යාංශයෙන් පමිණ ඔවුන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් කළ බවත්,වැසිකිළි ටික අමාත්‍යාංශයෙන් සකසා දෙන බව ප්‍රකාශ කල බවත්, ස්මාර්ට් විදිහට ආබාධිත අයට යන්න පුළුවන් විදිහට ලොකු මුදලක් යොදවා සෑදීමට පොරොන්දු අමාතයාංහය පොරොන්දු වු බවත්, සභාවේ පිරිත් පිංකම සිදු කිරීමට අවශ්‍ය වු නිසා එම මුදල් කාර්යාලිය වැසිකිලි පද්ධතිය සකස් කිරිමට යෙදවු බවත් , අනුමත වී තිබු මුදලට වඩා වඩා අඩු මුදලක් ඒ සඳහා වියදම් වු බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමා, ඒ කරපු වැඩේ ඉතා හොඳ වැඩක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා.

ගරු සභාපතිතුමනි, පොඩි අදහසක් ඉදිරිපත් කරන්නේ, අපේ ලේකම්තුමා, ගරු සභාපතිතුමා මහන්සි වෙලා මේ සඳහා මූලිකත්වය අරගෙන වැසිකිළිය නවීකරණය කිරීම පිළිබඳව මගේ ස්තූතිය මම පුද කරනවා .මොකද ,කෙටි කාලයක් තුලදී මෙය සිදු කිරීම අගය කල යුතුයි. මෙයින් පැහැදිලි වන දෙයක් තමයි අපි අවුරුද්දක පමණ කාලයක සිට මෙය ප්‍රතිසංස්කරණය විය යුතුයි කියා අපි කතා කරපු එක කෙටි කාලයක් තුලදී එය සිදු කල හැකියි කියන දෙයින් පැහැදිලි වෙනවා,අපිට මේක හදන්න පුළුවන් කියන එක එයින් පෙනෙන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා ප්‍රකාශයක් කරමින් කියා සිටියේය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ප්‍රාදේශිය සභාවේ කිසිම කෙනෙක් එයට විරුද්ධ වුණේ නැති බවත්, ඒ සඳහා සියලු ම ගරු මන්ත්‍රීතුමන්ලාට මන්ත්‍රිතුමියන්ලට ස්තුතිවන්ත වන බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන **ලදී.**

**ඒ අනුව** යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

05 (x) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 (xxx) මඟින් අතුරු ව්‍යවස්ථා පැනවීම සඳහා බලය ලැබී ඇති එකී පනතේ 122 වගන්තිය ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ වන අතුරු ව්‍යවස්ථාව පැනවීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

05 (xi) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) (ඊ) වගන්තිය මඟින් අතුරු ව්‍යවස්ථා පැනවීම සඳහා බලය ලැබී ඇති එකී පනතේ 122 වගන්තිය ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ දැන්වීම් පුවරු වෙනත් තාවකාලික නිර්මාණ හා සැරසිලි කටයුතු වන අතුරු ව්‍යවස්ථාව පැනවීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමල් නිමේෂ් බණ්ඩාර විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

05 (xii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 (vi), (viii) හා (ix) අනු වගන්ති මඟින් අතුරු ව්‍යවස්ථා පැනවීම සඳහා බලය ලැබී ඇති එකී පනතේ 122 වගන්තිය ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක ඉඩම් සැලසුම්, ඉඩම් අනු බෙදුම් සැලසුම් හා ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම, අනුමත කිරීම පිළිබඳ වන අතුරු ව්‍යවස්ථාව පැනවීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

06.(i) ගරු උපසභාපති යූ. එල්.එන්. මහේෂ් රත්නායක මැතිතුමා.

කැන්දන්ගමුව පහළගම සුසාන භූමියේ සොහොන් ගෙයි වහලය, මායාම් කණු තීන්ත ආලේප කිරීම හා ගේට්ටු කණු අලුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්. පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

06.(ii) ගරු උපසභාපති යූ. එල් .එන්. මහේෂ් රත්නායක මැතිතුමා.

නාකන්දල ආඩියාඔිවිට සුසාන භූමිය මැන මායිම් කණු දමා, ආවර්ණ වැටක් සකස් කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්. පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**06.(iii) ගරු උපසභාපති යූ. එල් .එන්. මහේෂ් රත්නායක මැතිතුමා.**

පැල්පිටිය සුසාන භූමිය වටා මායිම් කණු දමා සුසාන භූමිය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

**සභාපතිතුමනි, උපසභාපතිතුමා කලින් සංවර්ධන යෝජනා ඉදිරිපත් කරන්නවට අකමැති වුණත්, එතුම ම සංවර්ධන යෝජනා තුනක් න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති බවත්, එය ඉතාමත් ම අගය කරන බවත්, පැල්පිටිය ජනතාව වෙනුවෙන් උපසභාපතිතුමා කරන සේවයට ස්තුතිවන්ත වෙන බව,** ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල **මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.**

එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

07 (i) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සම්බන්ධීකාරණ කමිටුවේදී ගත් තීරණයක් පරිදි, ඇහැලියගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානය සතු අත් ට්‍රැක්ටර් 2 ක ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව වෙත භාර දී ඇත.මෙමගින් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට මෙන්ම ප්‍රදේශයේ ගොවි ජනතාව වෙතද මූල්‍යමය ප්‍රතිලාභ අත්වන පරිදි, මෙම සභාවට ආදායමක් හා ගොවි ජනතාවට සහන පදනමට සේවාවන් සැපයීමට යටත්ව, ලියාපදිංචි ගොවි සමිති වෙත ගිවිසුමකට යටත්ව රු.5000.00 දෛනික කුලී පදනම මත අත් ට්‍රැක්ටර් ලබා දීමටත්, ගොවි සමිති විසින් වරකට රු.3000.00 ක් වූ සුළු නඩත්තු වියදම් දැරීමේ උපරිමයකට යටත්ව, පෙර ගෙවුම් ක්‍රමය මත ගොවි සමිති වෙත ලබා දීමත් සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව **ගරු උපසභාපති යූ. එල් .එන්. මහේෂ් රත්නායක මැතිතුමා** විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා පෙ.ව 11.45 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු උපසභාපති යූ. එල් .එන්. මහේෂ් රත්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව පැහැදිලි කිරීමක් සිදු කරන්නම් සියලු දෙනාගේම දැන ගැනීම සඳහා.මෙය 2025 වර්ෂයේ අපේ අමාත්‍ය හිනිඳුම සුනිල් සෙනෙවි සහෝදරයාගේ විමධ්‍යගත අරමුදලින් ඇහැලියගොඩ ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුව හරහා ඇහැලියගොඩ ආසනය සඳහා ලැබුණ විමධ්‍යගත ප්‍රතිපාදන වලින් මෙම ට්‍රැක්ටර් දෙක ගත් බවත්, මෙය වාර්තාවේ වඩාත් නිවැරදිව සඳහන් විය යුතු නිසා, මේ කාරණය පැහැදිලි කරන බවත්, ගොවි සමිතියකින් තමයි විමධ්‍යගත යෝජනා විදිහට දාල ඉල්ලා තියෙන්නේ.බෝපැත්ත ගොවි සමිතිය ඉල්ලා තිබුණා, තව සමිතියක් ඉල්ලා තිබුණ.හැම වසමකම ගොවි සමිති ගොඩක් තියෙන නිසා, සමිතියකට විතරක් දෙනවා වෙනුවට ගොවිජන සේවා කාරක සභාවට මේ

ටික පැවරීම සිදු කළා. මේ යෝජනාව, මේ යෝජනා අනුමැතිය සියල්ල ආවේ ගොවිජන සේවා කාරක සභාවට ඒ අදාළ පැවරීම සිදු කර කරන ලෙසට. නමුත් ගොවිජන කාරක සභාවෙන් කිසිම ක්‍රියාමාර්ගයක් නොගත් නිසා ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවේම අනුමැතිය අනුව ප්‍රාදේශිය සභාවට පවරලා මෙහි තියෙන ක්‍රියාත්මක ආයතනය ලෙස ප්‍රාදේශිය සභාව මැදිහත් වෙලා, කටයුතු කරන්න කියලා දුන් උපදෙස් අනුව තමයි සභාවට මෙය ලැබුණේ. ඒ අනුව සභාවේ කාර්මික සේවා කාරක සභාවේ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි නදුන් මන්ත්‍රිතුමාගේ සභාපතිත්වයෙන් රැස්වෙලා, ලේකම්තුමත් සියලුම විෂය නිලධාරීන් එකතුවෙලා, ක්‍රමවේදයක් සැකසූ බවත්, ඒ ක්‍රමවේදය අනුව සභාවේ අනුමැතියට යොමු කළ බවත්, මේ ට්‍රැක්ටර් දෙකෙන් අපිට උපරිම ප්‍රායෝජනයක් ගන්න පුළුවන් වෙයි කියා සිතන බවත්, මේ කන්නය අපිට මග ඇරුනා. නමුත් ඉදිරි කන්නයේදී අපිට ලොකු වැඩ කොටසක් කනන්න පුළුවන් වෙයි කියා සිතන බවත්, ගරු උපසභාපති යූ. එල් .එන්. මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි ඩී.ගයානි බුද්ධිකා මැතිණිය.

ගරු සභාපතිතුමනි, මමත් ඒකට අහසසක් සිදු කරන්න අවශ්‍ය බවත්, අත් ට්‍රැක්ටරයක් ලබා ගැනීම සඳහා .2025-02-17 වෙනිදා ගොවි සමිතියක් හරහා නෙමේ ඒක යෝජනා වුණේ, බෝපැත්ත කොට්ඨාශ සභාව හරහා යෝජනා වූ බවත්,. ඒක මම හිතන්නේ විමධ්‍යගත ප්‍රතිපාදන මගින් අත්ට්‍රැක්ටර් දෙකක් ලැබුණු බවත්, කොට්ඨාශ සභාව විදිහට යෝජනාව සම්මතිති බවත්, අපේ වසමකට දානවට වඩා මේ ගන්නා විධිමත් ක්‍රියාවලිය පිළිබඳවත් කොට්ඨාශ සභාව ඉතාමත් පැහැදීමක් ඇතිවෙලා තිබෙන බවත්,. සැම වසම්වලටම ගෙනියන්න පුළුවන් තත්වයේ වැඩපිළිවෙලක් අනුගමනය කිරිම පිළිබඳව ප්‍රාදේශිය සභාවට ස්තුතිවන්ත වන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා පෙ.ව 11.48 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු සභාපතිතුමනි,මම නැවතත් මේ පිළිබඳව අහන්න කැමතියි. කිසිම ප්‍රශ්නයක් නැහැ මෙම ට්‍රැක්ටර් දෙක සභාවට ලබාගැනීම පිළිබඳව ගැටළුවකින් නෙමෙයි මම මේ කතා කරන්නේ. මෙම ට්‍රැක්ටර් දෙක ලබාගැනීම පිළිබඳ සභාවේ යෝජනාව සම්මත වුණා ද කියන කාරණය දැන ගන්න කැමතියි.

අංක දෙක තමයි ගරු සභාපතිතුමනි, අපේ සභාවේ පනත අනුව ගොවි ජනතාවත් එක්ක අපේ සම්බන්ධතාවයක් ගොඩනගනවා නම් සභා පනතේ කුමන ඡේදය යටතේද එම ගණුදෙනුව සිදුවන්නේ ද යන්න දැන ගැනීමට කැමති බවත්, මහජන උපයෝගීතාවයද ,එහෙම නැත්නම් වෙනත් කාරණාවක් සම්බන්ධවද සභාව ගොවිජන සේවා එකත් එක්ක කටයුතු කරන්නේ කියන කාරණය දැනගන්න කැමතියි බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා පෙ.ව 11.50 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මේක සභාවට පරිත්‍යාගයක් කරලා තියෙන්නේ,යෝජනා කරලා ඉල්ලපු එකක් නොවන බවත්,අපිට ඔවුන් පරිත්‍යාගයක් වශයෙන් කරන බවත්,මේකට මුදලක් බලාපොරොත්තු වුණ් නැති බවත්, නමුත් රු. 60000.00 ක් ගොවිජන සේවා එකට ඉන්ෂුරන්ස් කරන්න අතින් වියදම් වී ඇතිබව දැන් වු බවත්,. එම මුදල ලබා දෙන ලෙස ඔවුන් ඉල්ලීමක් කල බවත්, එයට අපි යෝජනා කළේ ඒ හැටදහස අපි දෙන්නේ ට්‍රැක්ටර් රථය කුළියට දීලා උපය ගත් ආදායමෙන් ලබා දෙන බවත්, සභා ආදායමේ ලබා නොදෙන බවත්, යනුවෙන් ඒකට උත්තර ලබා දුන් බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

අපි ඉල්ලීමක් කරලා නෙමෙයි සභාවට මේක පවරලා තියෙන්නේ.ඔවුන් පරිත්‍යාගයක් ලෙස භාරදීලා තියෙන්නේ. ඒක පැහැදිලියි. දෙවෙනි කාරණාව තමයි ප්‍රාදේශීය සභා පනතේ බලය අනුව ගොවිජනතාවත් එක්ක තමයි සම්බන්ධ වෙන්නේ. අපේ වත්කමක් ලෙස අපේ ට්‍රැක්ටර් ලබාදෙන්නේ ගොවිජනතාවට. අපි මේ සඳහා සම්බන්ධ වෙන්නේ මහජන උපයෝගීතාවය කියන පනතේ තියෙන බලය අනුවද කියා නැත්නම් වෙනත් කාරණාවක් අනුවද කියා පැහැදිලි කරගන්න අවශ්‍ය බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ගොඩක් දුරට සභාවට ආදායමක් ලැබෙන්නත් පුළුවන් බවත්, ඒක අපි ගොවිජනතාවට සහනයක් විදිහට සහ සභාවට ආදායමකුත් ලැබෙන බවත්, සභාව විසින් කිසිම මුදලක් වියදම් නොකර සභාවට ලැබෙන්නේ ආදායමක් බවත්, ඒ අංශයෙන් සභාවට ආදායමක් ලැබෙන කර්මාන්තය සහ ගොවි ජනතාවට සභාවෙන් සාධාරණ මිලකට වැඩ කටයුතු සිදු කිරීමක් ලෙස මෙය ලබා ගත් බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

අපි මෙතුවක් කාලයකට සභාවේ ගොවිජනතාවත් එක්ක සම්බන්ධ වෙලා නැති බවත්, අපේ විෂය පථයේ සභා පනත අනුව, පනතේ බලය අනුව ගොවි ජනතාවත් එක්ක සම්බන්ධ වෙලත් නැහැ. ගොවිජනතාවට සේවයක් සපයන්න පනත අනුව යම්කිසි බලතල හා කාර්යභාරයක් තියෙනවද යන්නත්, තමන්ගේ ගැටළුවක් නැති බවත්, අපි ඒක කරන්න ඕන බවත්,. නමුත් පනතේන් සභාවට බලය ලබා දී තිබෙනවාද. යන්න පැහැදිලි කිරීමකුත් අවශ්‍ය බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

වර්ෂය පුරාම කුඹුරු වැඩ නැති බවත්, ඒ නිසා ගොවි ජනතාවට විතරක් නොව අවශ්‍ය වෙනත් අයටත් ලබා දීමට හැකි බවත්, මෙය අනිවාර්යයෙන්ම ගොවි ජනතාවට ම දෙනවා කියලා බැඳීමක් නැති බවත්, කුඹුරු වැඩ කරන් නැති අනිත් දවස්වලට තව ආදායම් උපයන මාර්ග තියෙනවා නම් ඒ සඳහාද ලබා දිය හැකි බවත්, යන්න බැරි තැනකට කසල ටිකක් ගෙනියන්න තියෙනව නම්, ඒ සඳහාත් ප්‍රයෝජනයට ගත හැකි පරිදි මෙය යොදා ගැනිමට ගන්නා බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

සභාපතිතුමා බේරගන්න කතා කරන බවත්. සභා විෂයේ ගොවි ජනතාවට කුඹුරු වැඩ කරන්න නැති බවත්, මහජන උපයෝගීතාවය පිළිබඳ සාකච්ඡාවක් කරලා ඒ අනුව උදව් කරනව නම් උදව් කරන්න පුළුවන් බවත්, කසල ඇදීම යන කාරණාවේ දී, මේ යන්ත්‍රය මිලදී ගත් අරමුණ මේ ප්‍රදේශයේ ජනතාවගේ ගොවි ගැටළුවට පිළියමක් ලෙස තමයි මේ යන්ත්‍ර අරන් තියෙන්නේ. ඒ අරමුණත් වෙනස් කරන්න ගියොත් එහිදීත් සමහර වෙලාවට ගැටළුවක් ඇති වෙනවා. අනාගතයේ එන ගැටළුවක් පිළිබඳව මේ සාකච්ඡා කරන බවත්, ඒ සඳහා ඔබතුමාට මුහුණ දෙන්න වෙන බවත්, වත්කමක් ලෙස භාර ගෙන තිබෙන්නේ සභාවේ සාකච්ඡා කර ත් එකක් නොවන නිසා මෙයට පෞද්ගලිකව තමන්ට මේකට මුහුණ දෙන්න වෙන් නැති බවත්, මෙය පරිත්‍යාගයක් ලෙස ආව දෙයක් බවත්, මෙය අනාගතයේ ගැටළුවක් බවත්, ඒ නිසා මෙයට හරියට උත්තර හොයාගෙන යමු කියන කාරණය මෙයින් අදහස් කරන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්. මහේෂ් රත්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, ගරු දිලීන් මන්ත්‍රීතුමා කිවුව කාරණය හරි. මේ යෝජනාව දැම්මෙ ම, විමධ්‍යගත අරමුදලෙම තියෙන්නේ ගොවි ජනතාවගේ කාර්යයන් වැඩි දියුණු කිරීම සඳහා බවත්, ඒය ගොවිජන සේවා කාරක සභාවෙදි ක්‍රියාත්මක ආයතනය විදිහට සභාව නම් කළ බවත්, ඒ ව්‍යාපෘති යෝජනාව සමඟ ඉදිරියට ගෙන ගිය බවත්, එහිදී ගොවිජන කාරක සභාවට, ඒ ආයතනයට සේවකයින් බඳවා ගැනීමට තියෙන අපහසුව , ඒවා නඩත්තු කිරීමේ අපහසුව, එය නවතා තබා ගැනීමේ අපහසුව ඒ වගේ විවිධ අපහසුතා පෙන්වා දී මේ කාර්ය, මෙයින් බලාපොරොත්තු වුණ කාර්යය මාස ගාණක් තිස්සේ කෙරුන් නැති බවත්, ඒ නොකෙරුණ නිසා තමයි අපි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යෝජනාවක් දාලා, මෙය ප්‍රාදේශීය සභාවට පවරා දෙන්න කියලා ඉල්ලීම ඔවුන්ට කළේ. ගරු දිලීන් මන්ත්‍රීතුමා කිවුව කාරණය හරි බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනුත් මේ සම්බන්ධව විමසීමක් කළ බවත්, සම්බන්ධයෙන් ලියුමත් එන්න ඇති බවත්, විමධ්‍යගත අරමුදල සඳහා අපි යෝජනා දාපු එක ඒ විදිහටම දෙනවද බලන්න. අපට ප්‍රශ්නයක් තියෙන්නේ එතන විතරක් බවත්, සභාවක් විදිහට ගත්තොත් අපිට සභාවෙන් සේවා සපයන්න අපිට අයිතිය තියෙන බවත්, රථ වාහන කුළියට දීම, යන්ත්‍රෝපකරණ කුළියට දීමට, සභාවට අයිතිය තියෙන බවත්, ඒ නිසා එය අපට බාධාවක් නැති බවත්, එක බාධාවක් වෙන්න පුළුවන් බවත්, ගරු දිලීන් මන්ත්‍රීතුමා කියන එක හරි බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්. මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා.

පනතේ මෙහෙම තියෙනවා. “1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභා අරමුදලින් කිසියම් කොටසක්, කෘෂි කර්මාන්ත සහ ගෘහාශ්‍රිත සතුන් බෝ කිරීම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම සහ එම කාර්යයන් සඳහා පර්යේෂණ, ගොවිපලවල් සහ ගවපට්ටි නඩත්තු කිරීම සඳහා වියදම් කිරීම….” කියලා එහෙම එකකුත් තියෙනවා. එවල තියෙන ලිපිය හරියටම බලන්න බැරි වුණ බවත්, මෙය තවදුරටත් අධ්‍යනයක් කර විධිමත් කර ගත යුතු බවත්, ගරු සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මේ න්‍යාය පත්‍රයේ තියෙන යෝජනාව නිශ්චිත කර නොමැති බවත්, සභාවේ යම් යම් දේ සඳහා ගැනීමට පුළුවන් වෙන්න පුළුවන් බවත්, යෝජනාවේ කෘෂිකර්මාන්තයට කියන දේ ඇතුළත් වී ඇති බවත්, මේ යෝජනාව සංශෝධනයක් කළොත් යම් කාර්ය භාර්යකට යැමට හැකි බව අදහස් කරන බවත්, කෘෂිකර්මාන්තය නිශ්චිත කර තිබෙන නිසා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා එය පෙන්වා දීමට උත්සහ කළ බවත්, ඒ නිසා මේ සම්බන්ධව විධිමත් සාකච්ඡාවකට ගොස් තීරණයක් ගත්තොත් හොඳයි කියා හිතන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා හා ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා පෙ.ව 11.58 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මේ සම්බන්ධව විධිමත් සාකච්ඡාවකට යොමු වී, ගරු ආණ්ඩුකාරතුමියට යොමු කරලා අනුමැතියක් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට සුදුසු බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව යෝජනාව, ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යටත්ව කටයුතු කිරීමට යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා මධ්‍යහ්න 12.00 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ගරු සභාව මධ්‍යහ්න 12.00 ට තේ පැන් සංග්‍රහය සඳහා විනාඩි 15 කට කල් තබන ලදී.

තේපැන් සංග්‍රහයෙන් පසුව මධ්‍යහ්න 12. 15 ට නැවතත් සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

(උ) කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

i. මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තා -ඇමුණුම් ලේඛනය i / ii/ iii
ii. මිලදී ගැනීම් සම්බන්ධ ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව -ඇමුණුම් ලේඛනය iv
iii. පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව -ඇමුණුම් ලේඛනය ix
iv. ඒකාබද්ධ කාරක සභා වාර්තාව -ඇමුණුම් ලේඛනය x
v. පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව - ඇමුණුම් ලේඛනය ix
vi. නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය xi

(ඌ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.

i. 2026 අප්‍රෙල් මස ආදායම් වියදම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය vi
ii. 2026 අප්‍රේල් මස හිඟ ආදායම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය vii
iii. 2026 අප්‍රේල් මස ගෙවීම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය viii

(ඒ) සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය.**

තක්සේරු දෙපාර්තමේන්තුවේ ඒ නිලධාරීන් අනුමත කරන විදිහට වෙන්න ඇති නිලධාරීන් වරිපනම් බදු අය කන්නේ. නමුත් සභාපතිතුමා වරිපනම් බදු අයකරන විට ඒ නිවාස පිහිටීම අනුව,ඒ නිවාස වල

විශාලත්වය අනුව වරිපනම් තීරණය කරන බවත්. එ අනුව කටයුතු කරන්න චක්‍රලේකවලින් උපදෙස් ලැබෙන්න ඇති.අපේ වරිපනම් බදු වැඩිවීමත් සමඟ සමහර විට අවුරුදු හතර පහ තියෙන අයට ලොකු මුදලක් ගෙවන්න වෙලා තිබෙන බවත්, පුළුවන්නම් එක ලිහිල් කර වාරික වශයෙන් හෝ වේමට කටයුතු සලසා දෙන්න පුළුවන්නම් සුදුසු බවත්, බෝපැත්ත ඇඟලුම් කම්හල පිටුපස සදර්ලන්ඩ් වත්තේ මාසෙකට එක දවසක්වත් කිරි කපන්නේ නැති බවත්, ඒ නිසා ඒ වත්තේ තිබෙන ලොකු බකට් වගේ ඒවා අනිත් පැත්ත හැරවීමක් සිදු නොවන බැවින් මදුරු කීටන් සිටින බවත්. තමාගේ නිවස අසල ඇති ඒවා තමන් විසින් අයින් කර දමන බවත්, මේවන තෙක් ඒ අසල නිවෙස්වල නෙට් එකක්වත් නොදා සිටිය හැකි තත්වයක් තිබූ බැවින් රාත්‍රියේ නිදා ගැනීමට හැකියාවක් තිබූ බවත්.නමුත් මේවන විට පුදුම සහගත ලෙස මදුරු වසංගතයක් සිටින බවත්. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වෛද්‍යතුමා පැමිණි රැස්වීම අවස්ථාවේ තමන් මේ පිළිබඳව ලිඛිතව ලබාදුන් බවත්.නමුත් ඒ පිළිබඳව කිසිඳු කටයුත්තක් සිදුවී නොමැති බවත්. පසුව පිරිත් පිංකම දිනයේදී තමන් විසින් වාචිකව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා දැනුවත් කිරීමට කටයුතු සිදුකල බවත්. ඒ සම්බන්ධව ලිපියකින් හෝ දැනුම් දී,යම්කිසි ක්‍රියාමාර්ගයක් සිදු කරදෙන ලෙස ඉල්ලා සිටින බවත්. සෑම ලොකු බකට් එකකම වතුර පිරී මදුරුවන් සිටින බවත් එතුමිය විසින් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

**ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.**

මේ සම්බන්ධව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය දැනුවත් කිරිමට කටයුතු කරන බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා ප්‍රකාශ කළේ ය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා.**

බුලුගහපිටිය වසමේ පාරවල් හා කානු පද්ධතියක අක්‍රමිකතා සම්බන්ධව ලිපියක් ජනවාරි මාසේ සභාවට බාර දිමට කටයුතු කල බවත්, ඔබතුමා කාර්මික නිලදාරිතුමාව කීපවතාවක් ම ස්ථාන පරික්ෂාවක් කරන ලෙසට දැනුවත් කිරිමක් කළ බවත්, නමුත් මේවන විට කාර්මික නිලධාරි මහතා එම ස්ථානයට ගියපු බවක් දැන ගැනිමට නොමැති බවත්, ඒවායේ අතුරු ප්‍රතිඵල ලෙස තමාට කැළැපත්‍ර පවා එන බවත්, දුරකතනයෙන් තමාට තර්ජනය කිරිම් පවා තිබෙන බවත්, ඒ පිළිබඳව පොලිසිය දැනුවත් කිරිමට කටයුතු කල බවත්, මෙය දිගින් දිගටම මේ තත්ත්වය ඇති විමට හේතුව වන්නේ මේ කාරණාව හා තවත් කාරණා පවතින බවත්, ඒ සම්බන්ධවත් තමාට විවිධ මඩප්‍රහාර එල්ල වූ බවත්, ඒ සම්බන්ධව පොලිසිය දැනුවත් කළ බවත්,ඒ සම්බන්දව ඉදිරියට කටයුතු කරන බවත්, තමන්ට එල්ල වූ චෝදනා ගනන් ගන්න ඕන දේවල් නොවන බවත්,රාජකාරිය නිසි ලෙස ඉටු නොවීම පිළිබඳව තමාට ගැටලුවක් තිබෙන බවත්, කාර්මික නිලදාරි මහතා එම ස්ථාන පරික්සාවට නොයෑම සම්බන්දව ගැටලුවක් තමාට තිබෙන බවත්,සභාපතිතුමා කිවුවට යන්නෙත් නැති නිසා නොයෑමට හේතුව කුමක්ද යන්න තමාට ප්‍රශ්නයක් තිබෙන බවත්, කලින් සිටි ලේකම්තුමාව දැනුවත් දකලත් මේවන විටත් එම කාර්ය සිදු නෙවන බවත්, එහි වංචාවක් සිදු වී ඇති බවත්, තනි ගෙදරකට පාරක් කොන්ක්‍රිට් කර ඇති බවත්, ගේට්ටුවක් දමා ඇති බවත්, කාණුපද්ධතියක් දමා සම්පුර්ණ ඉඩමක් වෙන් කර ගෙන ඇති බවත්, ලක්ෂ 30-40 ක ව්‍යාපෘති දෙකක් බවත්, එතන කුමක් හෝ ප්‍රශ්නයක් වෙලා ඇති බවත්, ඒ සම්බන්ධව කුමන හෝ මන්ත්‍රිවරයෙක්, මේ සභාව නියෝජනය කරන පන්ත්‍රිවරයෙක් බවත්, ඒ සඳහා රාජකාරියක් ඉෂ්ඨ වෙන් නැත් නම්, ඒක සම්පුර්ණ වීඩියෝ කර විද්‍යුත් මාධ්‍ය හරහා එය ප්‍රචාරය කිරීමට සිදුවන බවත්, නමුත් එය සභාවට අගෞරවයක් බවත්,තමා ඒ දේට අකමැති බවත්, රාජකාරියක් කිරීමට කාර්මික නිලධාරි තුමා එම ස්ථානයට යැවීමට නොහැකි නම් වැඩක් නැති බවත්, ඒ සඳහා සාධාරණයක් කරණ ලෙස නැවත නැවත ඉල්ලිමක් කරන බවත්, මේ ඉල්ලීම් කරලා තිබෙන්නේ ගමේ මිනිසුන් වෙනුවෙන් බවත්, ගමේ මිනිසුන්ගේ උවමනාවක් වෙනුවෙන් තමා කතා කරන බවත්, තමාගේ පුද්ගලික තරහක් පිරිමහන දෙයක් නොවන බවත්,ඒ සඳහා සාධාරණ ක්‍රියාවකට යොමු වන ලෙස ඉල්ලා සිටිමින් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා විසින් අදහස් දැක්වීම සිදු කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා ප.ව 12.25 ට සභා ගර්භයෙන් පිට විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැණිකේ මැතිණිය.**

ලේකම්තුමාගේ අවධානයට මෙය ඉදිරිපත් කරන බවත්, 2025.10.12 වන දින මාහර වසමට අයත් මාහර පාර සම්බන්ධව සභාවට ලිපියක් බාර දී ඇති බවත්, මෙය සභාවට අයත් පාරක් බවත්, වෙනත් පිරිසකට අයත් ඉඩම්වලින් ඒ පාර ලබා දී ඇති බවත්, එම පාර ගමන් කරන්න බැරි මඩ වෙන පටු පාරක් විදිහට පවතින බවත්, මාහර බෝමළුව පිටකොරටුව පාර සඳහා තවමත් සාධාරණයක් ඉටුවී නොමැති බවත්. පා ගමනින් වත් ගමන්කල නොහැකි ලෙස මඩ පිරී එම පාර පවතින බවත්. නීතිමය ලෙසත් ගැටළු රාශියක් තිබෙන බවත් සභාවට අයත් පාරක් වැසීමේදී පොලිසිය හා සභාව ඒ සඳහා ක්‍රියාත්මක නොවූ බවත්. මිනිස්සු ඒ වෙනුවෙන් පෙනී සිටි බවට දැනට තොරතුරු ලැබී ඇති බවත්. නැවත එම ජනතාව මේ පිළිබඳව සභාවට ලිපියක් 2025-10-12 වෙනිදා ලබාදුන් බවත් ඉන් පසු 2026-01-13 වෙනිදා මහ සභාවේ යෝජනාවක් ලෙස ඒ පිළිබඳව ඉදිරිපත් කර ඇති බවත්. එම නිසා නීතිමය කටයුතු සිදුකර මිනිස්සුන්ට මේ පාර සාදා ගැනීමට කටයුතු සාදා දෙන ලෙසත්. මේවනතුරු ඒ පිළිබඳව ෆයිල් එකවත් තවම එළියට අරගෙන නොතිබූ බවත්.එබැවින් එම නීතිමය කටයුතු ඉදිරියට ගෙන එම පාර ජනතාවට ලබාදෙන්න කටයුතු කරන ලෙස තමන් ඒ පිළිබඳව ගෞරවයෙන් අපේ අලුත් ලේකම්තුමාගෙන් ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැණිකේ මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා ප.ව 12.30 ට නැවත සභාවට පැමිණෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා.**

**බෝපැත්ත කොට්ඨාශයේ** ගොවි ජනතාව වෙනුවෙන් ගයානි මන්ත්‍රීතුමිය එම කොට්ඨාශය නියෝජනය කරමින් මන්ත්‍රීතුමිය ගොවි ජනතාව නියෝජනය කරමින් එම යෝජනාව සිදු කරන්න ඇත්තේ එම ගොවි සංවිදානයේ ඉල්ලිමක් පදි වෙන්න් ඇතැයි සිතන බවත්, ගොවි ජනතාවට අත් ට්‍රැක්ටරයක අවශ්‍යතාවය දැනුන බැවින් විය හැකි බවත්. තමන් ගොවිතැන් කරන ගොවියෙක් විදිහටත්,ගොවි සංවිධානයක් නියෝජනය කරන සභාපති විදිහටත්, ගොවිතැන් කරන ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියටත්,තමාගේ පෞද්ගලික යෝජනාවක් ලෙස එම අදාල ගොවි සංවිධානය හරහා මෙම ට්‍රැක්ටර එකක් හෝ නඩත්තු වෙනවා නම්,සුදුසුයි කියා සිතන බවත් වැඩිදුරටත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.**

2026.03.24 දින පරිසර කමිටුවේ දී ඇහැලියගොඩ මැණික් පොළ අවට කාණු පද්ධතිය සුද්ද පවිත්‍ර කර දෙන ලෙසට තමන් විසින් යෝජනාවක් ගෙන ආ බවත්. ඒ පිළිබඳව අවශ්‍ය ස්ථාන සඳහා යොමුකර එම කටයුතු සලස්වලා දෙන බව පැවසූ බවත්. ඒ සම්බන්ධව කටයුතු කරලා තියෙන්නේ,කුමන ආකාරයටද යන්න පිළිබඳව හා එහි ප්‍රගතිය කෙසේද කියලා දැනගැනීමට කැමති බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා** විසින් ප්‍රශ්න කරන ලදී.

**ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.**

එස්කැවේටර් යන්ත්‍රයක් යොදාගෙන එය ඉටුකල යුතු බවත්. එහි ප්‍රතිපාදන සභාවෙන් අනුමත වී නොමැති බවත් මාර්ග සංවර්ධන අධිකාරිය හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට එය අයත් නොවන බව පවසන බවත් මාර්ග සංවර්ධන අධිකාරිය පවසා සිටින්නේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් බවත් නමුත් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් පවසන්නේ ඔවුන්ට අයත් නොවන බවත් ගරු සභාපතිතුමන් විසින් සඳහන් කරන ලදී. දුම්රිය දෙපාර්තමේන්තුවෙන් එය සොයා ගැනීමට නොහැකි බවත්.නමුත් අනිවාර්යයෙන්ම සිදුකල යුතු බවත්.චෝදනාව සභාවට තිබෙන බවත් නමුත් සභාවට එය සිදුකිරීමට එස්කැවේටර් යන්ත්‍රයක් තිබිය යුතු බවත්, මැණික් පොළේ සිදුවීම නිතර ඔවුන් තමන් සමඟත් පවසා සිටින බවත් ගරු ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.**

එදින පරිසර කමිටුවේදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමන්ද සිටි බවත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මහතුන් නිවෙස්වලට ගොස් කුරුම්බා කෝම්බ, සැමන් ටින් පෙන්වන බවත්, මෙතන විශාල පිරිසක් සිටින ස්ථානයක් බවත්. මෙම ස්ථානයේ ඩෙංගු මදුරුවන් සිටිය හැකි බැවින් සුද්ද පවිත්‍ර නොකරන්නේ ඇයි ද කියන කාරණය පිළිබඳව ඔවුන්ද ප්‍රශ්න කරන බවත් . එය සිදුවිය යුතු කටයුත්තක් බවත් . අද දින නීතියකට රීතියකට අනුව අසුන් ගැනීම පිළිබඳව ස්තුතිවන්ත වන බවත්, මෙතෙක් කල් එසේ සිදු නොවූ බවත්. නීතියක් රීතියක් අනුව අසුන් පැනවූවේ නැති බවත්, කැලෑ නීතියකට අනුව තමයි එම කටයුතු සිදුවී ඇති බවත් නමුත් නීතිය රීතිය භාවිතා කරලා නියම ආකාරයකට අසුන් පැනවීම පිළිබඳව තමන් ස්තුතිය මේ අවස්ථාවේදී පුදකරන බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.**

මේ සම්බන්ධව තමාට වඩා ලේකම්තුමාට ස්තුතිවන්ත වියයුතු බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා.**

පසුගිය දිනවල පැවැත්වූ පිරිත් පිංකම සහ දානමය පිංකම ඉතාමත්ම හොඳින් සාර්ථකව සිදු කළ බවත්. ඒ සඳහා සහයෝගය දක්වපු සියලුමදෙනාට ස්තුතිවන්ත වන බවත්. ඒ සම්බන්ධව විශාල ප්‍රබෝධයක් ඇති වී තිබෙන බවත්. ඒ හරහා සිදුවුණ භෞතික වෙනස්කම් පිළිබඳව පෙරද කතා කළ බවත්. එහිදී වැසිකිළිය සහ ශාලාව ඉතාමත්ම හොඳ මට්ටමින් ප්‍රතිසංවිධානය වී ඇති බවත් ඒ පිළිබඳව තමාගේ ස්තුතිය සභාපතිතුමාට සහ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට මේ අවස්ථාවේදී පුද කර සිටින බවත්.

ඊළඟ කරුණ ලෙස පසුගිය දිනවල පොළ ආශ්‍රිතව නඩුවෙන් ලැබූ ඉඩම සවර්ධනය කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ගය තුලින් ඒ අවට තිබුණු කඩ පොළට ඇතුලත් කරගැනීමට හැකියාව ලැබූ බවත්. එම වැඩ සටහන ඉක්මනට නැවත නැවතත් එම කටයුතු සම්පාදනය කර හැකි ඉක්මනින් එම කටයුතු ඉවර කිරීම සඳහා ඒ පිළිබඳව අවධානය යොමු කල යුතු බවත්, අප කුමක් කරන්නේද යන්න පිළිබඳව මිනිසුන් බලා සිටින බවත්, එමෙන්ම නගර සැලැස්ම සහ ඒ නගර සැලැස්මට මූලික වී තියෙන පදික වේදිකාව සුද්ද පවිත්‍ර කිරීම සහ ඒවායේ තිබෙන අඩුපාඩු දුරු කිරීමට ක්‍රියාමාර්ග ගැනීම ඉදිරියේදී සිදුවීමට තිබෙන බවත්. ඒ පිළිබඳවත් හැකි ඉක්මනට අවධානය යොමු කර එය ඉක්මනින්ම සිදුකරමු කියා කියා සිටින බවත්.

ඊළඟ කරුණ වශයෙන් වර්ෂාපතනය වේගයෙන් වැඩි වේගෙන යන බැවින් ආපදා කළමනාකරණය පිළිබඳව අපේ සියලුම මන්ත්‍රීවරුන් දැනුවත් කල යුතු බවත්. ඒ සඳහා අවශ්‍ය වැඩසටහනක් සභාව හරහා හැකි ඉක්මනට සිදුකල යුතු බවත්. සෑම ආයතනයක්ම මේවන විට ඒ සඳහා සූදානම් වන බැවින් අප ගමේ සිටින මිනිසුන් වශයෙන් මේ ගැටළු විශාල වශයෙන් ගමේ ඇති බවත් ඒ සඳහා අවශ්‍ය වැඩසටහනක් ස්ථාපිත විය යුතු බවට යෝජනා කරන බවත්.

ඊළඟ කරුණ ලෙස ගරු චන්ද්‍රදාස මන්ත්‍රීතුමා පැවසූ පරිදි මැණික් පොළ අවට එම කාණු පද්ධතිය පිළිබඳව අප නිරන්තරවම සාකච්ඡා කරන බවත්, එතන තිබුණ වැසිකිළි පද්ධතිය අප විසින් සම්පූර්ණ කළ බවත්. එය පෞද්ගලිකවම සභාපතිතුමාගේ මැදිහත් වීමෙන් ලක්ෂ 20කට කිට්ටු වෙන්න මුදලක් වියදම් කර, පරිත්‍යාගශීලීන් සමඟ සම්බන්ධ වී,එය සම්පූර්ණ කර ඇති බවත්. එය සම්පූර්ණ කළ ද එළියේ එහා පැත්තේ කාණු පද්ධතිය එතන ඉඳන්ම ඉදිරියට බලපාන බවත් . ඒ සඳහා නිරන්තරවම මැදිහත් වන බවත්. විමධ්‍යගත මුදල් හෝ ප්‍රාදේශීය සභාවෙන් හෝ මුදල් නොව අවශ්‍ය මූලික ආම්පන්න ටික ලබලා දෙනවා නම් ඒ සමඟ සම්බන්ධ වී එය ඉක්මනින්ම සිදු කළ හැකි බවත්. එය සභාවට හා මාර්ග සංවර්ධන අධිකාරිය හා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් නොවන බවත්. එය අපට අයත් වන බවත්. ඒ අවට සිටින මිනිසුන් නිරන්තරයෙන් අපේ මැණික් පොළත් එක්ක සම්බන්ධ වෙන පුද්ගලයින් ලෙසත් හැමදාම එතෙන්ට ගිය පසු එම අඩුපාඩුව කියා සිටින බවත්.එම නිසා තමන් සිතන ආකාරයට ඉක්මනටම ගරු සභාපතිතුමා මැදිහත් වී,මෙම කාණු පද්ධතිය ඉවත් කල යුතු බවත් බැකෝ එකක් හෝ නැත්නම් එතන ඉන්න අයද පැවසුවහොත් ඒ සඳහා මුදල් දෙන බවත්. අප ඒ සඳහා සම්බන්ධ කරන ලෙසත්, මේ පිළිබඳව නිරන්තරයෙන්

මන්ත්‍රීතුමන්ලාද ,මුදලාලිලා ද එතන සිටින පිරිසද පවසන බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කරන ලෙසත්. ඒ වෙනුවෙන් සහයෝගය ලබාදෙන බවත් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

මදුරු කීටයන් පිළිබඳ ප්‍රශ්නය අනෙක් කරුණ බවත් ටින් හා පොල් කටු එකතු කිරීමෙන් එම ගැටළුව නොවිසඳෙන බවත්, එම නිසා මේ පිළිබඳව අප කලින් පරීක්ෂණයක් සිදුකල බවත් ඒ අනුව මදුරු කීටයන් සෑම වත්තකම හබරල ගස් සහ නොයෙක් මල් ගස් වල,කොන්ක්‍රීට් ස්ලැබ් වල ,කාණු පද්ධති වල බිත්තර දැමීමෙන් ඇති වන බවත් දුම් ගැසීමෙන් පමණක් එය අවසන් කල නොහැකි බවත් සිදුකල වැඩසටහන් පිළිබඳව සතුටු වන බවත් අතීතයේ මදුරු කීටයන් සම්බන්ධ සාර්ථක වැඩ සටහනක් සිද කළ බවත්, ඉදිරියේ දීද ඒ හා සම්බන්ධ වී එම වැඩසටහන් සිදු කරන ලෙස යෝජනා කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී **එච්.ආරියදාස මැතිතුමා** විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා.**

දිවුරුම්පිටිය ගැටහැත්ත ප්‍රදේශයේ 40 ක් 50 ක හරක් රංචුවක් සිටින බවත්, ඊයේ දිනයේදීත් එක් මනුස්සයෙක්ට හරකෙක් ඇන්නා කියලා ආරංචි වු බවත්, එම පුද්ගලයා රෝහල් ගත කර ඇති බවත්, එම හරක් රංචුව ඒ අවට මිනිසුන්ට ද මාර්ගයේ ගමන් ගන්නා පුද්ගලයින්ට ද පීඩවක් බවත්, මේ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න කියලා ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.**

රණවීර මන්ත්‍රීතුමා,ඒ හරක් අයිතිකාරයින් සිටින හරක්ද යන්න ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා.**

අයිතිකාරයන් සිටින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

**ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.**

සභාවට ඒ සඳහා ක්‍රියාත්මක විමට බලයක් තිබෙන බවත් ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ගවලට යොමු විමට අවශ්‍ය බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා.**

එම සතුන් කිරි නිෂ්පාදනය සඳහා ඇති කිරන සතුන් නොවන බවත්, කිරි නිශ්පාදනයක් එම සතුන්ගේ නොමැති බවත්, ඇඹිලිපිටියෙ තිබෙන තිබෙන සතුන් ඇති කරන මධ්‍යස්ථානයට එම සතුන් අල්ලා දිය හැකි බවත්, ගම්වල ඉන්න සත්තු එම ආයතනයට භාර දෙන බවත්,මස් සඳහා එම සතුන් යොමු නොවන ආකාරයට පොලිසියත් සම්බන්ධ කර ගෙන යම් ක්‍රමවේදයකට යෑම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා ප්‍රකාශ කළේය.මෙම සතුන් නිසා ලොකු අනතුරු ටිකක් ඇති වෙන බවත්,දිනක් පාරේ යද්දි වැස්සියකට පැටියෙක් හම්බෙන්න සිටි බවත්, ඒ සඳහා මැදිහත් වුවත් පැටියා බේරා ගැනිමට නොහැකි වු බවත්. මෙම සතුන් ප්‍රධාන මාර්ගයේ රාත්‍රී කාලයේ නිදා සිටීම නිසා පාරේ අනතුරු බොහොම වෙන බවත්, එයත් විශාල ගැටළුවක් බවත්, ඒ සඳහා සභාව විදිහට තීරණයක් ගත යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා ප.ව 12.48 ට සභා ගර්භයෙන් පිට විය

**ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.**

ඊළඟ සභා වාරයේදී හරියට ප්‍රදේශය හා ප්‍රමාණය නිශ්චිතව යෝජනාවක් ඉදිරිපත් කර ඉදිරි පියවරක් ගනිමු කියා ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා.**

අපේ මහජන ක්‍රීඩාංගනය අසල ඇළ ඇළ සුද්ද කර දෙන ලෙසට සභාවේ කිහිප වරක්ම කතා කළ බවත්, නමුත් නාගරික සංවර්ධන අධිකාරියට සම්බන්ධ කර, කිසිදු ප්‍රතිචාරයක් නම් ලැබුණේ නැති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

අනෙක් කරුණ ඇහැලියගොඩ ගවමස් කඩය සම්බන්ධව මීට කලින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා සභාවට ලිඛිතව දැනුම්දීල තිබෙනවා එම ස්ථානයට වීදුරුවක් සවිකරලා දෙන්න ලෙසට, බස් නැතුම්පලත් තියෙන නිසා දූම වැඩි බවත්, අනිවාර්යයෙන් සභාවට ලොකුම ආදායමක් ගන්න තැනක් නිසා, ඒ මිනිස්සුන්ගේ ප්‍රශ්න බලන්න ඕන බවත්, සභාවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා ලිඛිතව දෙපාරක් දුන්බව කියූ බවත්, .කිසිම ප්‍රතිචාරයක් නම් ලැබුණේ නැහැ, ඒ නිසා මන්ත්‍රිතුමා පොඩ්ඩක් මතක් කරන්න කියා කිවූ බවත්, අනෙක් කරුණ මෝරගල නගරයේ කානු පද්ධති වැලි වලින් පිරිලා තිබෙන බවත්, එම නිසා ඒ ටික සුද්ද පවිත්‍ර කළා නම් එම ඇලට වතුර ටික බැස යන බවත්, නැත්නම් පාරෙන් වතුර යන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා ප.ව 12.50 ට නැවත සභාවට පැමිණෙන ලදී

**ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.**

මස් වෙළඳසැලේ ඇස්තමේන්තු සකසා ඇති බවත්, අනුමත ආයතනයක් මඟින් එම කාර්ය කිරිමට පමණක් ඇති බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.**

විලේගොඩ කොට්ඨාශයේ මේ දිනවල ලොකු ප්‍රශ්නයක් තිබෙන බවත් , බෝපැත්ත වසමට අයත් පෞද්ගලික ඉඩමක ගස් ටිකක් කපන බවත්, නමුත් ඊට පහළින් තියෙන ඉඩම අයත් වෙන්නේ විලේගොඩ වසමට. විලේගොඩ වසමේ නාය යෑමේ අවධානමට වෙන් කරපු කොටසකට ඉහළින් මේ ඉඩම පවතින බවත්, නමුත් ප්‍රාදේශිය ලේකම්තුමියත් දැනුවත් කරලා ,ග්‍රාම නිලධාරීතුමිය දැනුවත් කළ පසු ග්‍රාමනිලදාරිතුමිට එම ස්ථානගොස් බැලූ බවත්, නමුත් දැන් විලේගොඩ වසමට අයත් ඉඩමක් නෙවෙයි මේක බෝපැත්ත වසමට අයත් ඉඩමක් බවත්, මෙම ඉඩම පෞද්ගලික පුද්ගලයෙක්ගේ ඉඩමක් බවත්, ප්‍රාදේශිය ලේකම්තුමිය සහ ආපාදා මහත්මයත් සමඟ කතා කළ බවත්, ඔවුන් කියන්නේ පෞද්ගලික ඉඩමක ගස් කපන එක තහනම් කරන්න විදිහක් නැහැ කියා බවත්, උපසභාපතිතුමාවත් දැනුවත් කල බවත්, එතුමත් ගොඩනැගිලි පර්යේසණ ආයතනය සමඟ කතා කල බවත්, හේ ප්‍රශ්නය වන්නේ වසම වෙනස් වුණත්, මේ ගස් කැපීම නිසා විලේගොඩ වසමට නාය අවධානම බලපාන බවත්, පහල ඉඩම නාය අවධානම අයින් කළ ඉඩමට ඉඩමට අඩ ඉඩමේ තිබෙන ගස් කපන නිසා.වතුර පාරට හේදිලා ආවොත් මෙය ලොකු ප්‍රශ්නයක් වෙන බවත්, අද දිනයේත් අපදා නිලධාරින් ග්‍රාම නිලධාරීන් සමඟ ආපදා රැස්වීමක් පවත්වන බවත්, තමන්ට ද දැන් ඒ සඳහා කතා කල බවත්, හෙට දින පවත්වන පමහජන දිනයේ දී ඇමතිතුමා දැනුවත් කිරිමට කටයුතු කිරීමට වැඩ කටයුතු සිදු කරමින් පවතින බවත්. පැරිම තැන පොලිසියට පැමිනිල්ලක් කල බවත්, පොලිසියට පැමිණිල්ලක් කලත් පොලිසියෙනුත් තවම නිසි ක්‍රියාමාර්ගයක් අරගෙන නැති බවත්, ප්‍රාදේශිය ලේකම්තුමිය කියන ආකාරයට එතුමියගේ පැත්තෙන් හරි ඇති . පෞද්ගලික ඉඩමක ගස් කපන එක එතුමියට නවත්වන්න බැහැනේ. ගැටළුව වෙලා තියෙන්නේ ඊට පහළින් තියෙන්නේ අවධානම් කලාපයක්. එක් වරක් පුපුරලා මිනිසුන් දැඩි අවධානම් කියලා ඉවත් කරලා ,අර්ධ අවධානම් කියන ඉඩම. බලපෑම තියෙන්නේ විලේගොඩ වසමට බවත්, ඉඩමේ අයිතිය තියෙන්නේ බෝපැත්තට. බෝපැත්ත ග්‍රාම නිලධාරී මහත්මයා සමඟත් සාකච්ඡා කළ බවත්, සභාපතිතුමා මැදිහත් වෙලා,මෙයට ඉක්මන් විසඳුමක් ගන්නවා නම් හොඳයි. ඔහුගේ පුද්ගලික ඉඩමේ රබර් ගස් තමයි කපන්නේ. අපි කියන්නේ උඩ ගස් ටික

කැපුවට කමක් නැහැ.අවධානමට කිට්ටුව තියෙන ගස් ටිකවත් පාරෙන් යට නවත්වන්න කියලා බවත්,. මමත්,ග්‍රාම නිලධාරීතුමියත් ගියා.අපිට පේනවා ඒ ටික කැපුවොත් සේදී යනවා. බැකෝ යන්ත්‍රයකින් මුල් සමඟ ගැලෙව්වොත් සේදී යනවා. වසමේ නිවෙස් තිහ හතලිහක් තියෙනවා. එම නිවෙස් සඳහා අවධානමක් එනවා. කැකුලුලියද්ද ගල්මැදුරවත්තට උඩින් තියෙන්නේ. එම ස්ථානය එක පාරක් නාය ගිය කොටසක්. ඔවුන්ගේ පැත්තෙන් බැලුවහොත් ඔවුන් සාධාරණව සිදුකරනවා ඇති. නමුත් වැසි කාලයක් පැමිණෙන නිසා වසමට විශාල හානියක්.වැස්සෙන් පසු වතුර පාර ඇවිත් එය කඩාගෙන ගියොත් කරන්න දෙයක් නැහැ.එම නිසා ගෙයක් දෙකක් යටවෙන්න කලින් මේ සඳහා ක්‍රියාමාර්ගයක් ගන්නවා නම් හොඳයි. මම හිතන්නේ ඔවුන් හෙට දින අපේ ඇමතිතුමා හමුවීමට බලාපොරොත්තුවෙනවා. එහිදීත් බලලා අපි මේකට විසඳුමක් ලබාදෙන්න කියලා මම ගෞරවයෙන් සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එමෙන්ම අපේ ආරියදාස මන්ත්‍රීතුමා කිවුවා වගේම මැණික් පොළේ ගැටළුවටත් මැදිහත් වීමක් සිදුකරලා දෙන ලෙස ඉල්ලා සිටිනවා. චන්ද්‍රදාස මන්ත්‍රීතුමත් එය මතක් කළා. එමෙන්ම පිරිත් පිංකමට සහභාගී වුණ සියලුම දෙනාටම මම හිතන්නේ,ඒ සඳහා විශේෂයෙන් ස්තුතිවන්ත විය යුත්තේ අපේ කාර්යාල නිලධාරීන්ට. අපිටත් වඩා ඔවුන් සියලුදේම අඩුපාඩුවක් නැතුව සිදුකරලා තිබුණා. එමෙන්ම පක්ෂ විපක්ෂ සියලුදෙනා සහභාගී වුණා.

ඔවුන්ගේ දායකත්වය ලබාදුන්නා. සභාපතිතුමාගේ සහ ලේකම්තුමාගේ මැදිහත් වීමෙන් විශාල පිංකමක් සිදු කළා. මම හිතන්නේ ඒකත් හොඳයි. එමෙන්ම නැවත වතාවක් කියන්නේ මුලින් කී කරුණු පිළිබඳවත් සොයා බලා,සාධාරණයක් ඉටුකර දෙන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් අදහස් දැක්වීම සිදු කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.**

ගරු සභාපතිතුමා ගරු මන්ත්‍රීතුමාගේ පැහැදි කිරීමට දෙයක් එකතු කරන්න අවශ්‍ය බවත්, නාය යන කොටසේ ගස් කපන එක පිළිබඳව ග්‍රාම නිලධාරීතුමියට කතා කළාම කිවුවා නැ/විලේගොඩ කියලා. නැ/විලේගොඩ ග්‍රාම නිලධාරීතුමියට කතා කළාම කිවුවා, එය අයත් වෙන්නේ බෝපැත්ත ග්‍රාම නිලධාරීතුමාට කියලා. වසමේ සියලුදෙනාම මම දැනුවත්කිරීම් සිදුක බවත්, මෙහෙ ආපදා නිලධාරීතුමාට වෙනම ලිඛිතව දැනුම් දුන් බවත්, මෙහි ගැටළුව තියෙන්නේ,ගෙවල් එතන ඉවත් කළා වගේම විලේගොඩ වසමට ලොකු බලපෑම තියෙන්නේ කැකුනලියද්ද ප්‍රදේශයට බවත්, එම ස්ථානයේ රාත්‍රී 1 ට 2 ට එම ගස් කපලා බැකෝ යන්ත්‍ර දාගෙන, ලයිට් දාගෙන, එම ක්‍රියාවලියකුත් යන බවත්, සමන්සිරි මන්ත්‍රීතුමා කිවුවා වගේම ප්‍රාදේශිය ලේකම්තුමිය කියන්නේ එයාට ඒ පැත්තෙන් මුකුත් කරන්න බැහැ කියා බවත්, එහි නීත්‍යානුකූල පැත්ත මොකක්ද කියා දන් නැති බවත්, ඒ වුණත් පහල නාය යන ප්‍රදේශයක් තියෙන විට නතර කරන්න බැහැ කියන එකේ ගැටළුවකුත් තිබෙන බවත්, එම නිලධාරීන් කොපමණ දැනුවත් කලත් වැඩක් නැති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා ප.ව 12.50 ට සභා ගර්භයෙන් පිට විය.

**ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.**

හෙට දින පැමිණෙන නිසා ඇමතිතුමා හරහා MDRO එකට කියලා මේ සඳහා විසඳුමක් ලබා ගැනීමට කටයුතු කරන බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, කුඹුරු වැඩ කරන කොට උපසභාපතිතුමා වියලගොඩ මාර්ගයේ දී හමු වූ බවත්,වියලගොඩ, මැදපිටිය, නාකන්දල මාර්ගයේ. එතුමා විසින් ප්‍රකාශ කළා, ප්‍රතිපාදන වෙන් වෙලා තියෙන්නේ පාර හදමු කියලාමැදපිටිය පාර ඉක්මනින් හැදුවොත් නාකන්දල හා මැනික්දොළ ජනතාවට මාහිංගොඩට හා නගරයට පැමිනිමට කෙටිම මාර්ගයක් වෙන බවත්, එය ඉක්මනින් සිදු කර දෙන ලෙසට ඉල්ලිමක් කරන බවත්,

ඊට අමතරව ගරු සභාපතිතුමාගේ අවධානයට යොමු කරන්නේ මෙතන තේ බොන්න දුන්නොත් මේ සභාව පිටුපස කොටස කුස්සියක් වෙන බවත්, ඒකට ඇත්තටම තමන්ගේ දැඩි විරෝධතාවය ප්‍රකාශ කරන බවත්, මෙතන රතු පාට කාපට් එක. කිරි එකක් එහෙම හැලුනොත් එහෙම, මම දන්නේ නැහැ කවුරු ද මේ වගේ තීරණ ගන්නවද කියලා. ඔබතුමා මේ පිළිබඳව අවධානය යෙමු කරන්නමෙතන කෝලම් මඩුවක් නොවන බවත්, මෙතන කඩයක් වගේ බවත්,මේ සඳහා මගේ දැඩි විරෝධතාවය ප්‍රකාශ කරන බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය මතු කල කාරනාව සම්බන්ධව අවධානය යොමු කරන බවත් , නාය යාමේ සිද්ධිය නිවාස 60-150ත් අතර ප්‍රමාණයකට බලපෑමක් ඇති කරන බවත්. තව ඉඩම් වලින් කොටසක් අධි අවධානම් කියා අයින් කර ඇති බවත්. එහෙම පසුබිමක් මත මෙම කටයුත්ත දිගින් දිගටම සිදු වන බවත්. එම නිසා ඒ සඳහා නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමට හැකියාවක් තිබිය යුතු බවත්. එය අයත් වෙන්නේ බෝපැත්ත ප්‍රදේශයට වුවත් බලපෑම ඇත්තේ විලේගොඩ ප්‍රදේශයට බවත්. දැනටත් වැසි දිනවලදී නාය යාමේ අවධානමක් තිබෙන බවත්, අපදා එකෙන් වැසි ඇද හැලුනොත් ඉවත් වන ලෙස දැනුම්දී ඇති බවත්. මේ සම්බන්ධව ඉල්ලීමක් සිදුකරන බවත්.මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරන්න කියා ප්‍රකාශ කරන බවත්,

ඊට අමතරව හදිසි යෝජනාවක් ලෙස පසුගිය සභා වාරයට ඉදිරිපත් කළ ඇහැලියගොඩ ජාතික පාසලේ සහ ප්‍රාදේශීය සභාවේ ඉඩමක් සම්බන්ධව ගැටළුව සම්බන්ධයෙන් දිගින් දිගටම ගැටළුවක් මතු වී ඇති බවත්. ඇහැලියගොඩ ජාතික පාසලේ මුර කුටිය හා ගේට්ටුව ඇතුළු ගොඩනැගිල්ලක් සකස් කිරීම අපේක්ෂාව බවත් එය ප්‍රමාද වීම නිසා ,ජාතික පාසලේ ප්‍රවේශවන ගේට්ටුව සහ එම ගොඩනැගිල්ල නොමැති නිසා දැනට ටික කලක සිට පාසලේ අලංකාරයට විශාල ගැටළුවක් ව ඇති බවත්. එම නිසා එයට විධිමත් මැදිහත්වීමක් වී එම කටයුත්ත නිවැරදි කර දෙන ලෙස නැවතත් දිගින් දිගටම මතක්කර සිටින බවත් දිගින් දිගටම යෝජනා ඉදිරිපත් කර ඇති බව සෑම සභා වාරයකම වාර්තාවල තිබෙන බවත්. එම නිසා ඒ සඳහා විධිමත්ව මැදිහත් වන ලෙස නැවතත් යෝජනා කරන බවත්,

එමෙන්ම ඊළඟට අවුරුදු සමයේ කසළ බැහැර කිරීම සම්බන්ධව විධිමත් සැලැස්මක් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතුව නොතිබූ බවත්. ගරු ආරියදාස මන්ත්‍රීතුමාට මුදන්නායක මන්ත්‍රීතුමාටත්, ගරු ගද දැනුන ද දන්නෑ.ඒ පාලම ලග ට්‍රැක්ටර් දෙකක විතර කුණු තිබූ බවත්, කසල සත්තු ඇද දමා තිබූ බවත්, පාරෙ තමයි තිබුනේ. කසළ කිවුවහම විවිධ ජාති තිබූ බවත්. ඒ සෑම දෙයක්ම අඩංගු බවත් සභාවේ ඒ පිළිබඳව නොකිවයුතු බවත්.එම නිසා මෙවැනි අවුරුදු කාල වලදී සේවකයින් නිවාඩු ලබා ගන්නවා නම්, ප්‍රාදේශීය සභාව සතු විධිමත් සැලැස්මක් තිබිය යුතු බවත්, අප මෙම කාලයට කුමක්ද ගන්නා පියවර සම්බන්ධයෙන් හා මෙම කසළ බැහැර කිරීම පිළිබඳව. ප්‍රාදේශවාසීන් දැඩිව ඒ සඳහා විරෝධතාවය දක්වා තිබූ බවත්. ප්‍රාදේශීය සභාවට ලිඛිතව දැන්විය යුතුයි පැවසුවාට එසේ දන්වන්න කියා තමා කිවු බවත්, නිශ්චිත කරුණක් සම්බන්ධව දන්දෙනිය පාරේ පාලම අසල මෙවැනි විශාල ප්‍රමාණයක් කසළ ගොඩගැසී තිබූ බවත්. ඒවා සත්තුන් විසින් පාරට ඇදල දමමින් අධික දුගඳක් හැමූ බව දුරකථනයෙන් තමන් වෙත දැන්වූ බවත්, තමන්ට අවශ්‍ය මෙවැනි තත්වයක් ලබන අවුරුද්දෙත් සිදු නොවෙන්න කටයුතු කරන්න කියා පැවසීමට බවත්. ලබන අවුරුද්දෙත් සේවකයින් නිවාඩු ගන්න පුළුවන්. විධිමත් ක්‍රියාමාර්ගයක් සඳහා යාම සුදුසු බවත් වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් අදහස් දක්වන ලදී.

**ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.**

සාමාන්‍යයන් බලද්දි ඇහැලියගොඩ එවැනි තත්වයක් නොතිබූ බවත්, එලෙස පැමිණිල්ලක් හෝ ජනතා විරෝදයක් ඇති නොවූ බවත්, ජනතාව අවුරුදු සමයේ සිදු කල සේවය පිළිබඳ ප්‍රශංශා කළ බවත්, මේ සම්බන්ධව සෞඛ්‍ය කම්කරුවන්ට ස්තුති වන බවත්, 100% නිවරදි නොවෙන්න පුළුවන් බවත්, ඒ කාර්ය මෙහෙයවන්න වෙනම නිලධාරියෙක් ගත් බවත්, 14 වෙනිදා පමණක් එම නිලධාරීන් නිවාඩු ගත් බවත්, එම නිලධාරීන්ට විශේෂ ස්තුතියක් පුද කරන බවත්, සාමන්‍ය විදිහට බලන විට ඇහැලියගොඩ කසල පිළිබඳ ලොකු ප්‍රශ්නයක් නොවූ බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.**

සුසානාගාරයේ නඩත්තු කටයුත්තක් සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් කල බවත්, මේවන තෙක් එම නඩත්තු කටයුත්ත සිදු වී නොමැති බවත්, එය සේවකයන්ටත් එම රාජකාරි කටයුතු කිරිමට ගැටලුවක් බවත්, එම නඩත්තු කටයුතු හැකි ඉක්මනින් සිදුකර එය ක්‍රමානුකූලව විධිමත් විද්‍යාත්මක ක්‍රමවේදයකට කටයුතු කිරීම සඳහා පසුබිම නිර්මාණය කරදෙන ලෙස ඉල්ලා සිටින බවත්. එමෙන්ම තත්කාරය පදනම මත සේවකයින් විවිධ කටයුතු සඳහා බඳවා ගනු ලබන බවත්. එම නිසා සුසුනාගාරයටත් තත්කාර්ය පදනම මත සේවකයෙක් බඳවා ගැනිමට කටයුතු කරන ලෙසත්, එම කටයුත්ත සඳහා සම්බන්ධ වන පුද්ගලයා හදිසියේ ලෙඩ වී රෝහල්ගත වුවහොත් සුසුනාගාරයේ කටයුතු අත්හිටුවීමට සිදු වන බවත්, එම නිසා ඒ සඳහා පුහුණු විය හැකි තත්කාර්ය පදනම මත හෝ සේවකයෙක් බඳවාගෙන එම කටයුත්ත සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස යෝජනා කරන බවත්.

ඊළඟ කරුණ ලෙස පොළ භූමිය අසල කඩ කාමර ටෙන්ඩර් පටිපාටියකට යොමු කළත්, තවම එය විධිමත් ආකාරයෙන් වෙළෙන්දන් සඳහා පවරා නොමැති බවත්, V හැඩැති කඩ කාමර ටික තමන් දැනුවත්ව ඇති ආකාරයට තවම පවරා නොමැති බවත්. එහි නීතිමය කටයුත්ත සිදුවී මාස කිහිපයක් වන බවත්. අවශ්‍ය ස්ථාන සඳහා යොමුකර එය පවරා එම කටයුතු සලසා දෙන ලෙසත්,එසේ සිදුකර ඇත්ද යන්න තමා නොදන්නා බවත්, ,එසේ සිදුකර නැත්නම් ඒ අවස්ථාව හැකි ඉක්මනින් සිදුකර දෙන ලෙසත්. කිරිපෝරුව මිටිපොළ මාර්ගය අබලන්ව දැඩි අපහසුතාවයකට ලක්ව තිබූ බවත්, ගරු තුෂාරි මන්ත්‍රීතුමිය ඒ පිළිබඳව ඍජු මැදිහත් වීමක් වී රජයේ ප්‍රතිපාදන යොදවා එම මාර්ගය ක්‍රමවත්ව සෑදීමට මහන්සි වූ බවත් ඒ පිළිබඳව විශේෂ ස්තුතියක් සිදු කරන බවත්, ඒ ක්‍රමවේදය ම දම්මුලල් මාර්ගය සඳහා ද යොදා ගැනිමට කටයුතු කරන ලෙසත්, කරඳන දම්මුල්ල මාර්ගය දැනට ඇළට ගසා යාමට ලක්වෙමින් පවතින බැවින්. ඒ සඳහාත් නඩත්තු කටයුත්තක් සිදු නොවුනහොත්,විශාල ගැටළුවක් සඳහා ඉදිරියේදී මුහුණ දිය හැකි බවත්.එම නිසා ඒ සඳහාත් විධිමත් මැදිහත් වීමක් විය යුතුයි කියා තමන් අදහස් කරන බවත්. ඒ සඳහාත් මැදිහත්වීමක් අපේක්ෂා කරන බවත් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

එමෙන්ම ඉදිරියේදී ආපදා කටයුත්තක් ඇති වෙයි කියලා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවත්, විශේෂයෙන්ම රජයේ ආපදා කටයුතු පිළිබඳ අදාල නිලධාරීනුත් සන්නිවේදන හරහා ලොකු මැදිහත්වීමක් සිදු වී ඇති බවත්. සභාව එවැනි කටයුත්තක් සිදුවුවහොත් මැදිහත්වීම කෙසේද සිදු වෙන්නේ,අපිට වෙන්න පුළුවන් මැදිහත් වීම කෙසේද අපි සම්බන්ධ වෙන්නේ කොහොම ද යන්න අදහසක් අපේක්ෂා කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා.**

ශක්තිමත් හෙටක් වෙනුවෙන් ක්‍රිඩාව සඳහා තරුණ තරුණියන් සම්බන්ධ කර ගැනීම වෙනුවෙන් ඇහැලියගොඩ ප්‍රදේශයේ තරුණ තරුණියන් ක්‍රීඩාව සඳහා යොමු කිරීමට ඇහැලියගොඩ ප්‍රදේශයේ තරුණ තරුණියන්ට යම් වැඩපිළිවෙලක් අපේ සභාව විසින් හෝ යෝජනා කරන බවත්, ඔවුන්ගේ මානසික ඒකාග්‍රතාවය පවත්වා ගැනීමට, සමාජ සම්බන්ධතාවලට, මත්ද්‍රව්‍ය තුරන් කිරීමට වැනි වැඩසටහන් සඳහා විශාල මැදිහත් වීමක් ක්‍රීඩාව මගින් සිදු වන බවත් ඇහැලියගොඩ ප්‍රදේශයේ මීන්නාන ,බෝපැත්ත, විලේගොඩ මෙන්ම නොයෙකුත් ප්‍රදේශයේ වොලිබෝල් ක්‍රීඩාංගන තිබෙන බවත්.එවැනි දේ පිළිබඳව සිතා බලා එම ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම කල යුතු බවත් තවද අප හට හොඳ ක්‍රීඩා පරපුරක් සිටින බැවින්. එම ක්‍රීඩා පරපුරේ තරුණ තරුණියන්ගේ දක්ෂතා ඉදිරියට ගෙන යාමට අප සභාවක් ලෙස සභාවේ යම් නිශ්චිත ප්‍රදේශයකට, කණ්ඩායමකට ක්‍රීඩා වැඩසටහනක් ගෙන යාම සුදුසු බවත් යෝජනා කරන ලදී. ප්‍රදේශයේ අනාගතය තිබෙන්නේ මෙම ක්‍රීඩාවත් සමඟ බැවින් ක්‍රීඩාවට තරුණ තරුණියන් යොමුකිරීම තුළින් ඔවුන්ගේ මානසික ඒකාග්‍රතාවය හා දරුවන්ගේ තිබෙන සහ සම්බන්ධතා වැඩි වී හොඳ ශක්තිමත් තරුණ පරපුරක් ආසනෙන් එළියට යන බවත් වැඩිදුරටත් සඳහන් කරන ලදී. එමනිසා අප සභා පනතේ රෝම ඉලක්කන් 19යටතේ තිබෙන ක්‍රීඩාව සම්බන්ධයෙන් හා ක්‍රීඩා භාණ්ඩ ලබාගැනීම සඳහා අපිට යම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල හැකි බවත්, ඒ පිළිබඳව යම් අවධානයක් යොමුකර ඉදිරියට ක්‍රීඩාශීලී තරුණ පරපුරක් බිහිකිරීම වෙනුවෙන් යම් වැඩසටහනක් ප්‍රාදේශිය සභාව මට්ටමින් ඉදිරියට රැගෙන යා යුතු බවට යෝජනා කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමාවිසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.**

ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න කිහිපයක් පිළිබඳව කතා කිරීමට තිබෙන බවත් පළමු කරුණ වශයෙන් මෑතකදී මිල වැඩිකරන ලද විදුලි බිල සම්බන්ධයෙන් ප්‍රදේශයේ ජනතාවට තදින් දැනී තිබෙන බවත්. විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල නියැලෙන ව්‍යාපාරිකයන් වෙනුවෙන් මෙය දැඩි පසුබෑමකට ලක්වෙන තීරණයක් බවත් සඳහන් කරන ලදී. ඒ අනුව කුමන හෝ හේතුවක් නිසා, සමහරු විශ්වාස කරනවා මේ ලෝකයේ තිබෙන අර්බුද නිසා විදුලි බිල වැඩි වී තිබෙන බව,සමහරෙක් විශ්වාස කරනවා බවත් සමහරු ගල් අඟුරු ගැටළුව නිසා විදුලි බිල වැඩිකරන්න සිදු වූ බවත් හා ඩීසල් වැඩිවෙන්න ගත් නිසා විදුලි බිල වැඩිකරන්නට තීරණය කළ බවත්. විශ්වාසය කෙසේ වෙතත් මෙම විදුලි බිල වැඩි වීම තුළ අපේ ජනතාවට ව්‍යාපාරිකයන් වශයෙන් පීඩනයක් ඇති වෙලා තියෙන බව මතක් කරන බවත්, හැකිනම් ඔබතුමන්ලාගේ එම ආණ්ඩුවේ තිබෙන රැස්වීම් වලදී , ජනතාවත් සමඟ තියෙන රැස්වීම් වලදී , බලධාරීන් සමඟ තියෙන රැස්වීම් වලදී මේ පිළිබඳව කතා කර හෝ මෙම විදුලි බිල මත ජනතාවගේ තිබෙන පීඩනය ඉහළට දැනුම් දෙන ලෙස ඉල්ලා සිටින බවත්, අප කැගසමින් ,එළියට බැහැල විදුලි බිල අඩුකරන්න කියමින් තීරණ වලට නොයන පක්ෂයක් ලෙස අවුරුද්දකට වැඩි කාලයක් ඔබතුමන්ලාට බලය ලබාදී ඇති බවත්, තවම ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීම සඳහා අවස්ථාව තිබෙන බවත්, ඔබලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ විදුලි බිල තුනෙන් එකක් අඩුකරනවා කියලා ජනතාව පැහැදිලිව රවට්ටපු අවස්ථාවක මෙම වර්තමාන ගැටළුව ඇති වී ඇති බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී **දිලීන් කරුණාපාල මැතිතුමා** විසින් ප්‍රකාශ කරන ලදී.

දෙවන කරුණ වශයෙන් විද්‍යුත් මුදල් ගනුදෙනු සඳහා වැට් 2.5%ක් වැඩි කරලා තිබෙන බවත්. අපේ ප්‍රදේශයේ තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක්, අපි දන්න, අපෙන් ඉගෙන ගන්න, අපි ආශ්‍රය කරන තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් මෙම විද්‍යුත් මුදල් ජනනය කිරීමේ ව්‍යාපාරවල යෙදී ඇති බවත්, සමහරතරුණයේ නිවෙස්වල සිට ව්‍යාපාවල නියලෙන බවත්, මේ වන විට මෙම 2.5ක වැට් එක වැඩිවීම තුළ ඔවුන්ගේ ව්‍යාපාර අඩාල වී තිබෙන බවත් එවිට ජනතාවාදී ආණ්ඩුවක් නම් මෙවැනි තීරන ගැනීම තුළ මෙම ජනතාව අපහසුතාවයට පත්කරන්නේ ඇයි කියන කාරණය ජනතාව අපෙන් විමසන බවත්. එම නිසා මෙය සාකච්ඡා කිරීම සඳහා මෙය වේදිකාවක් කරගත යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී **දිලීන් කරුණාපාල මැතිතුමා** සඳහන් කරන ලදී. එබැවින් මෙම අවස්ථාවේ දී ජනතාවට සහන දෙනවා මිසක් ,ජනතාවගේ බදු වැඩි කර ජනතාව හුරගෙන කන තීරණ ගන්න ප්‍රවේශයකට යන්න එපා කියන ආයාචනය කරන්න කැමති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී **දිලීන් කරුණාපාල මැතිතුමා** විසින් ප්‍රකාශ කරන ලදී.

ඊළඟ කරුණ ලෙස පොහොර අර්බුදය බවත්, ප්‍රදේශයේ නැවත වගා කිරීම සඳහා ලොකු පෙළඹීමක් තිබූ බවත්, දැන් අපි විනාඩි කිහිපයකට කලිනුත් කතා කල පරිදි ,කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය සම්බන්ධ ට්‍රැක්ටර් දෙකක් සම්බන්ධව. ප්‍රාදේශිය සභාව මැදිහත් වෙලා මෙම කෘෂි කර්මාන්තය නගා සිටුවිය යුතු බවත් . නමුත් අත්‍යවශ්‍ය පොහොර ලබාදෙන්න රජයේ වැඩපිළිවෙලක් නොමැති බව ජනතාව ප්‍රකාශ කර සිටින බවත් එම නිසා මෙම ප්‍රදේශයේ බොහෝ පිරිස් මේ කන්නයේදී ගොවිතැන අත්හරින ප්‍රමාණය වැඩි බවත්. එම වගාකරන පිරිසටවත් පොහොර ටික ලැබෙන්න ක්‍රමවේදයක් නොමැති බවත්. යම්යම් අවස්ථා වලදී ගොවිජන සේවා එකත් සමඟ සාකච්ඡා කළත්,ඔවුන් ප්‍රකාශ කරන්නේ රජයෙන් හම්බවෙන්න ඕන තොග මේ වනකොටත් ලැබී නොමැති බවත්, එම නිසා ඒ පිළිබඳව මැදිහත් වන ලෙසත්. මේ මොහොතේ ආරංචි වූ පරිදි හෙට මහජන දිනය බවත්. මහජන දිනය දවසේ ගොවීන් කීප දෙනෙක් ඒ සම්බන්ධව සාකච්ඡා කරන්න පැමිනෙන බවත්, ඒ සම්බන්දයෙන් තමාව දැනුවත් කර ඇති බවත්, ඒ පිලිබඳව අවධානය යොමු කරන ලෙසත්, මේ ආණ්ඩුව පත්වූයේ කෘෂි කර්මාන්තය නගා සිටුවීමට බවත්, ඉස්සර පාරට බැහැලා ගොයම් කාලා වැඩ දාපු අය අද ඇමතිලා මේ අහිංසක ගොවිජනතාව ගැන අවදානය යොමු කොට නැති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී **දිලීන් කරුණාපාල මැතිතුමා** විසින් ප්‍රකාශ කරන ලදී.

ඊට අමතරව තෙල් මිල වැඩිවීමත්. පසුගිය කාලය තුළ ලෝක තෙල් මිල අඩු වෙලා තිබූ බවත්. බැරලයක ඩොලර් 80ක් වගේ ප්‍රමාණයක් අඩුවෙලා තිබුණ බවත් නමුත් එම අඩුවීම තුළ එම අඩුවීමේ සහනය මේ ලංකාවේ ජනතාවට උරුම නැති බවත්, ක්‍රමවත් මිල සූත්‍රයක් ක්‍රියාත්මක වූ බවත්. දැන් මිල සූත්‍රය ක්‍රියාත්මක නොවන බවත්. ආණ්ඩුවට අවශ්‍ය විදිහට තෙල් මිල වැඩි කරලා ඇති බවත් රු.1000.00ට ගහන්න පුළුවන් පෙට්‍රල් ලීටර් 2 යි තව පොඩ්ඩකුත් පමණක් බවත්, ජනතාව දැඩි අපහසුතාවයකට පත්ව ඇති බවත් මෙම

තෙල් මිල අඩුකිරීම සම්බන්ධව අවස්ථාව තිබෙන බවත් නමුත් මෙම ආණ්ඩුව අවස්ථාව නොගන්නා බවත් සඳහන් කරන ලදී.එය මහ පුදුම සහගත ක්‍රියාවක් බවත්. මෙම ආණ්ඩුව තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන්

බැහැර වෙලා මෙම අහිංසක ජනතාවට දැඩි පීඩනයක් එල්ල කරන අවස්ථාවක් බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **දිලීන් කරුණාපාල මැතිතුමා** විසින් ප්‍රකාශ කරන ලදී.

ඊලඟ කරුණ වශයෙන් තමන් ගමන් ගන්නා පැල්පිටිය මාර්ගය මාර්තු 31දිනය වන විට සාදා නිමකරන බව පැවසූ බවත්,නමුත් තවම එය සිදුවී නොමැති බවත්, පැල්පිටිය මාර්ගය මේවන විට කෙසේවත් ගමන් කළ නොහැකි තත්වයකට පත්ව ඇති බවත්, බස් රථයට කෙසේවත් ගමන් කල නොහැකි බවත් , බස් එක ගමන් ගන්නා එක නවතා ඇති බවත්, එම නිසා ඉක්මන් තීරණයක් ගත යුතු බවත්, මෙම ප්‍රාදේශීය සභාවේ ඇස්තමේන්තුවක් සකස්කර තිබෙන බව ආරංචියක් තිබෙන බවත්,එය ක්‍රියාත්මක වන ස්වභාවයක් පේන්නට නොමැති බවත්,ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **දිලීන් කරුණාපාල මැතිතුමා** විසින් ප්‍රකාශ කරන ලදී.

ඊළඟ කරණ වශයෙන් කසළ ගැටළුව පවතින බවත්,මෝරගල පාලම පසුවන විටම නැවත කුණු දැමීම අරම්භ කර ඇති බවත්, කසළ දානවා,නැවත ගෙනියනවා,නැවත දානවා එම නිසා මේ සඳහා තිරසර විසඳුමක් අවුරුද්දක් තුල අරගෙන නොමැති බවත් අපි කතා කරන්නේ කසළ අදින කාරණය පිළිබඳ නොවන බවත් කසළ ගැටළුව සඳහා තිරසර විසඳුම කුමක්ද බවත් විමසන ලදී. කසළ ගැටළුව සඳහා තිරසර විසඳුමක් තිබෙන බව ගරු සභාපතිතුමා බලය ලබාගැනීමට පෙරත් සමහර ස්ථාන වල කුනු ප්‍රශ්නය සඳහා තිරසර විසඳුමක් තිබෙන බව පවසා තිබූ බවත්, නමුත් ඒ තිරසර විසඳුම වසරක් ගත වුවත් පෙනීමට නොමැති බවත් වැඩිදුරටත් පවසන ලදී. ගියවර සභාවේදී එම කසළ දමන ස්ථාන වල බෝඩ් ගැසීමට සූදානම් වූ බවත්,නමුත් එම බෝඩ් ගසා තිබෙනවා දැක්කෙ නැති බවත්, බෝඩ් ගසා තිබේද යන්න පිළිබඳව අවධානය යොමු කරන ලෙසත්,අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කාර්යක්ෂමතාවයක් නොදකින බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **දිලීන් කරුණාපාල මැතිතුමා** විසින් ප්‍රකාශ කරන ලදී.

අවසාන වශයෙන් දැනට තිබෙන තවත් එක් ගැටළුවක් ලෙස සභාවේ 107 වගන්තියේ අ,ආ අනුව ජනතාවට විශාල ගැටළුවක් පවතින අනතුරුදායක ගස් ඉවත් කිරීම පිළිබඳ ගැටළුව සඳහා සෘජු බලය ලැබී ඇත්තේ ප්‍රාදේශීය සභාවට වුවද නමුත් ලිපි යොමු කිරීමේ කටයුතු පමණක් සිදුකරන බවත්, ඒ පිළිබඳ කටයුතු පමණක් සිදුවන බවත්, ගස් කැපීමක් සිදු නොවන බවත්, අනතුරුදායක තත්වයෙන් ජනතාව මුදාගන්නා වැඩපිළිවෙලක් නොමැති බවත්, එම නිසා ඒ සඳහා ගස් කපන්නෙක් ඉදිරිපත් කරගෙන මෙම සේවාව කාර්යක්ෂම කරන වැඩපිළිවෙලකට යොමු විය යුතු බවත් ඉදිරියේදී වැසි තත්වය, සුළං තත්ත්වය වැඩි වෙන බවත්, ජනතාව බලා සිටිනුයේ මෙම අනතුරුදායක තත්වයෙන් මිදීමට බවත්, මේ ඉල්ලීම් කීපය මේ සභාවේ ඉදිරිපත් කිරිම සඳහා ජනතාව තමා වෙත ලබා දුන් ඉල්ලීම් බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **දිලීන් කරුණාපාල මැතිතුමා** විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ප.ව 1.12 ට සභා ගර්භයෙන් පිට විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණිය.**

මිටිපොළ කොට්ඨාශයේ සංවර්ධන කටයුතු පිළබඳව අදහසක් පැවසීමට තිබෙන බවත් වසම් දෙක තුනකට යාමට නොහැකිව අබලන් තත්වයේ පැවති ප්‍රධාන මාර්ග දෙකක් හා 2025 වර්ෂයේ සංවර්ධනය කල බතලකොටුව මාර්ගයත් ,කිරිපෝරුව,මීටිපොළ,සමන්පුර යන මාර්ගයට ප්‍රධානව තිබෙන මාර්ග කොටස සංවර්ධන කටයුතු පළාත් සභා ප්‍රතිපාදන මගින් වෙන්කර සංවර්ධනය කිරීමට කටයුතු කල බවත් ඒ පිළිබඳව ප්‍රදේශවාසීන්ගේ විශේෂ සතුටක් පවතින බවත්, ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා සොයා බලා නිරීක්ෂණ කටයුතු සිදුකිරීම විශාල ශක්තියක් වූ බවත් ඒ පිළිබඳව ස්තුතිවන්ත වන බවත්, එමෙන්ම යෝජනාවක් ලෙස මිටිපොළ කිරිපෝරුව වසමේ තරුණ පිරිසක් ස්වේච්ඡාවෙන් ඉදිරිපත්ව කසළ කළමනාකරණය හා කසළ පිළිබඳව ඔවුන්ගේ අදහසක් මත පොදු ස්ථානවල කසළ භාජන ස්වේච්ඡාවෙන් රඳවා ඇති බවත් එය යහපත් වැඩපිළිවෙලක් බවත් ඒ සම්බන්ධව වරිපනම් සීමාවේ නොවුනද මසකට එක් වරක් හෝ ඔවුන්ගේ වසම් වලටද එම කසළ එකතු කිරීමේ ට්‍රැක්ටරයක් ලබා දෙන ලෙසට ග්‍රාමීය ජනතාවගේ අදහසක් පවතින බවත. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා ද කසළ පිළිස්සීම සිදු නොකරන ලෙස සඳහන් කරන බැවින් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවස්ථාව ලබාදෙන ලෙසත් ඉල්ලීමක් කරමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණිය විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.**

මන්ත්‍රී දීමනාව මෙම ස්ථානයට ගෙනවිත් දීම පිළිබඳව මන්ත්‍රීවරුන්ගේ ගෞරවය පුද කරන බවත්,මැයි 28 වන දින සිට ආරම්භ වන වෙසක් සතිය තුළ අස්ගඟුල ප්‍රදේශයේ විහාරස්ථානයේ බෞද්ධ විමලරතන මධ්‍යස්ථානය අවට ස්ථානයේ මෑතකදී සිදුවූ විදුලි කෙටීමක් හේතුවෙන් කණුවල බල්බ් 05ක් 06ක් ප්‍රමාණ පිළිස්සී ඇති බවත් 24 වන දින දහම් පාසල් දරුවන්ගේ සීල ව්‍යාපාරය හා රාත්‍රී වැඩසටහන් පවතින බැවින් ඒ සඳහා ඔබතුමාගේ ගෞරවනීය අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ප.ව 1.15 ට නැවත සභාවට පැමිණෙන ලදී.

2026.05.12 වන දින සාමාන්‍ය සභා රැස්විම 1.20 ට නිමාවට පත් විය.

බන්ධුලසේන දුණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2026 ක් වූ.................................මස...........දින
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ දී.